කාර්ය සාධන වාර්තාව 2021

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 207

පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	.....	01 - 09
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම		
2.1	විශේෂ ජයග්‍රහන, අභියෝග සහ ඉදිරි ඉලක්ක	.....	10 - 23
2.2	කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග	.....	24 - 27
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මුල්‍ය කාර්ය සාධනය		
3.1 – 3.9	මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශ	.....	28 - 34
3.10	මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන වාර්තාව	.....	35 - 50
පරිච්ඡේදය 04 -	කාර්ය සාධන දර්ශකය	.....	51
පරිච්ඡේදය 05 -	තිරසර සංවර්ධන (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	.....	52 - 56
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	.....	57 - 58
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	.....	59 - 66

01.පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සඳහා 1940 අංක 9 දරන පුරාවස්තු අඥා පනත යටතේ ස්ථාපිත කර ඇති අතර, වත්මන් කටයුතු 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතට අනුව සිදු කරනු ලබයි. පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණයේ නියාමක ආයතනය වශයෙන් කටයුතු කරනු ලබන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට 2021 වර්ෂයේ ජූලි මසට වසර 131 සපිරිනි.

2019.12.10 දිනැති අංක 2153/12 දරන ගැසට් පත්‍රයට අනුව බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2020.08.09 දිනැති අංක 2187/27 දරන ගැසට් පත්‍රයට අනුව ආරක්ෂක අමාත්‍යාංශය යටතට සහ 2020.11.20 දිනැති අංක 2202/25 දරන ගැසට් පත්‍රයට අනුව ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට පැවරුණි.

දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු ශාස්ත්‍රීය හා ශාස්ත්‍රීය නොවන දෙඅංශය යටතේ සිදුවන වන අතර, ආයතන අරමුදල් ප්‍රවාහය භාණ්ඩාගාර ප්‍රතිපාදන, පොදු තැන්පත් හා බාහිර ආයතන ප්‍රතිපාදන අරමුදල් යටතේ පවති. 2021 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මූලධන ප්‍රතිපාදන රුපියල් මිලියන 261.900 සහ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 1,253.300 ක් ලෙස දෙපාර්තමේන්තුවට වෙන් වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1,515.200 ක් විය.

දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද මුල්‍ය ප්‍රතිපාදනයන් තුළින් උපරිම කාර්යක්ෂමතාවක් ලබා ගැනීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම හා අරමුණු සාක්ෂාත් කර ගැනීම Covid - 19 වසංගතය හමුවේ 2020 වර්ෂය මෙන් 2021 වර්ෂය ද අභියෝගාත්මක වර්ෂයක් විය. එම අභියෝග හමුවේ වුවද ජාතික ප්‍රතිපත්තින්ට අනුගතව රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කර ගනිමින් පුරාවිද්‍යා ස්ථාන ප්‍රසස්ථ මට්ටමට ගැනීම සහ සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු 2021 වසර තුළදී සාර්ථකව සිදු කරන ලදි. ඒ අනුව, භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 398 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට හැකි විය.

2021 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන නොමැති බැවින්, මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවූ අතර, පොදු තැන්පත් හා බාහිර ආයතන ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 21 ක් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

❖ දැක්ම

සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනාලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම.

❖ මෙහෙවර

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණයේ වගකීම දරන උපරිම ආයතනය සහ එහි ප්‍රධාන නියාමක ආයතනය ලෙස කටයුතු කිරීම.

❖ අරමුණු

ඉහත මෙහෙවර ඉෂ්ට කර ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුණු කිහිපයකි.

01. සම්පත් ප්‍රවර්ධනය
    i). මානව
    ii). ආයතනික
02. සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂණය
03. පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම
    i). ස්ථාන සහ ස්මාරක
    ii). චංචල පුරාවස්තු
04. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
05. පුරාවිද්‍යාත්මක ස්ථාන / ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තුව.
06. පර්යේෂණ.

1.3. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම.
2. ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
3. පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
4. පුරාවිද්‍යා ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
5. සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම.
6. පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම.
7. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම.

1.4. සංවිධාන සටහන


සංවිධාන ව්‍යුහය -පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) 01 (ශ්‍රී ල.ප.සේ. විශේෂ ශ්‍රේණිය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කාන්තිය) 01 (අදාළ කළමනාකාරිත්වය)
ප්‍රධාන අභ්‍යන්තර විගණක 01 (ශ්‍රී ල.ප.සේ. ශ්‍රේණිය 1)
අධ්‍යක්ෂ (පාලන) 01 (ශ්‍රී ල.ප.සේ. ශ්‍රේණිය 1)
ප්‍රධාන ගණකාධිකාරී 01 (ශ්‍රී ල.ප.සේ. ශ්‍රේණිය 1)
අධ්‍යක්ෂ (වාහන,මෙහෙයුම්,ඇප.) 01 (අදාළ කළමනාකරණ ශ්‍රේණිය 1)
අධ්‍යක්ෂ (ග.ශාඛ.) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (කැණීම්) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (විස්තෘතිලේඛන හා ප්‍රකාශන) 01 (ශ්‍රී ල.ප.සේ. - ශ්‍රේණිය 1)
ප්‍රධාන ඉංජිනේරු 01 (ශ්‍රී ල.ප.ඉං.සේ. - ශ්‍රේණිය 1)
අධ්‍යක්ෂ (රක්ෂණ හා සංරක්ෂණ) 01 (ශ්‍රී ල.ප.වි.ද.සේ. - ශ්‍රේණිය 1)
අධ්‍යක්ෂ (ගිණුම්) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ප්‍රහාර විරෝධී) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ප්‍රහාර විරෝධී) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ගබඩා සේවා) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ගබඩා සේවා) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ප්‍රහාර විරෝධී) 01 (අදාළ කළමනාකරණ)
අධ්‍යක්ෂ (ප්‍රහාර විරෝධී) 01 (අදාළ කළමනාකරණ)
ප්‍රාදේශීය කාර්යාල 09
ප්‍රාදේශීය කාර්යාල 09
ප්‍රාදේශීය කාර්යාල 09
ප්‍රාදේශීය කාර්යාල 10
ප්‍රාදේශීය කැණීම් හා ගණකාකාගාර නිලධාරී 09
ප්‍රාදේශීය කාර්යාල 09

01	පාලන	-	පාලන
02	පුහුණු හා වෙනත්	-	පුහුණු හා වෙනත්
03	ව්‍යා. ක්‍රියා. හා ඇ.	-	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඇගයීම
04	ව්‍යා. මෙ. හා අ.	-	ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ
05	ග.ලේ.	-	ගවේෂණ හා ලේඛන ගත කිරීම්
06	පුවි. බල.තක්.	-	පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරුකරණය
07	මුහුදු. පු. ගවේ	-	මුහුදු පුරාවිද්‍යා ගවේෂණය
08	කැණීම්	-	කැණීම්
09	කැ.තක්.හා.පර්	-	කැණීම් තක්සේරුකරණය හා පර්යේෂණ
10	වාස්තු විද්‍යා සං.	-	වාස්තු විද්‍යා සංරක්ෂණ
11	වැඩ හා ලෝ.උ.	-	වැඩබිම් හා ලෝක උරුම
12	භූමි අලංකරණය	-	භූමි කළමනාකරණය
13	නව ඉදිකිරීම්	-	නව ඉදිකිරීම්
14	රසායන සංරක්ෂණ	-	රසායන සංරක්ෂණය
15	චිත්‍ර සංර.	-	චිත්‍ර සංරක්ෂණය
16	පුරාවස්තු සංර	-	පුරාවස්තු සංරක්ෂණය
17	අභි. නාණක විද්‍යා	-	අභිලේඛන හා නාණක විද්‍යා
18	අභිලේඛන	-	අභිලේඛන
19	නාණක විද්‍යා	-	නාණක විද්‍යා
20	ප්‍රවර්ධන	-	ප්‍රවර්ධන
21	තෙරතුරු කළ. හා ප්‍රකා.	-	තොරතුරු කළමනාකරණ හා ප්‍රකාශන
22	වැඩබිම් හා ස්මාරක	-	වැඩබිම් හා ස්මාරක
23	ආයතනික ගොඩනැගිලි	-	ආයතනික ගොඩනැගිලි
24	ජේ.කා.නි./ජේ.සැ.ශි.	-	ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී / ජ්‍යෙෂ්ඨ සැලසුම් ශිල්පි
25	නි.අ. / ස.අ.	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
26	ශ්‍රී. ලං. ප. සේ.	-	ශ්‍රී ලංකා පරිපාලන සේවය
27	ශ්‍රී. ලං. ග. සේ.	-	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
28	ශ්‍රී. ලං. ඉ. සේ.	-	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
29	ශ්‍රී. ලං. වා. සේ.	-	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය
30	ශ්‍රී. ලං. විද. සේ.	-	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
31	ක. සේ.නි.සේ.	-	කළමනාකරණ සේවා නිලධාරී සේවය
32	ශ්‍රී. ලං. තා. සේ.	-	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය

1.5. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ / පළාත් හා දිස්ත්‍රික් කාර්යාල

❖ දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ

ශාස්ත්‍රීය අංශ

- ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය
- කැණීම් අංශය
- කෞතුකාගාර අංශය
- වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය
- රසායන සංරක්ෂණ අංශය
- අභිලේඛන හා නාණක විද්‍යා අංශය
- නඩත්තු අංශය
- ප්‍රවර්ධන අංශය
- මාධ්‍ය අංශය

ශාස්ත්‍රීය නොවන අංශ

- ගිණුම් අංශය
- පාලන අංශය
- ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය
- නීති අංශය

❖ දෙපාර්තමේන්තුව යටතේ පවතින පළාත් හා දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාල

- බස්නාහිර පළාත
- මධ්‍යම පළාත
- දකුණු පළාත
  - ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක
  - හම්බන්තොට දිස්ත්‍රික්කය
- උතුරු පළාත
  - යාපනය/ කිළිනොච්චි දිස්ත්‍රික්ක
  - මන්නාරම්/ මුලතිව්/ වවුනියා දිස්ත්‍රික්ක
- වයඹ පළාත
- උතුරුමැද පළාත
  - අනුරාධපුර දිස්ත්‍රික්කය
  - පොළොන්නරුව දිස්ත්‍රික්කය

❖ ඌව පළාත
  - බදුල්ල දිස්ත්‍රික්කය
  - මොණරාගල දිස්ත්‍රික්කය

❖ සබරගමුව පළාත
  - කෑගල්ල දිස්ත්‍රික්කය
  - රත්නපුර දිස්ත්‍රික්කය

❖ නැගෙනහිර පළාත
  - අම්පාර/මඩකලපුව දිස්ත්‍රික්ක
  - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

❖ පළාත් කාර්යාල යටතේ ඇති කලාප කාර්යාල

1. බස්නාහිර පළාත
   - අංක 01 - කෝට්ටේ කලාපය
   - අංක 02 - කොළඹ කලාපය
   - අංක 03 - උඩුගම්පොළ කලාපය
   - අංක 04 - ගම්පහ කලාපය
   - අංක 05 - පතහවත්ත
   - අංක 06 - ගනේඋඩ

2. මධ්‍යම පළාත
   - අංක 01 - සීගිරිය
   - අංක 02 - දඹුල්ල
   - අංක 03 - මැණික්දෙන
   - අංක 04 - මොරගහකන්ද
   - අංක 05 - නාලන්ද ගෙඩිගේ
   - අංක 06 - මාතලේ
   - අංක 07 - හාරිස්පත්තුව
   - අංක 08 - මහනුවර
   - අංක 09 - යටිනුවර
   - අංක 10 - උඩුනුවර
   - අංක 11 - කුණ්ඩසාලය
   - අංක 12 - හගුරන්කෙත
   - අංක 13 - කොත්මලේ
   - අංක 14 - නුවරඑළිය

3. දකුණු පළාත - ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක
   - අංක 01 - හික්කඩුව
   - අංක 02 - ගාල්ල
   - අංක 03 - කඩවත් සතර හා ගාලු කොටුව
   - අංක 04 - මාතර
   - අංක 05 - කඹුරුපිටිය

4. දකුණු පළාත - හම්බන්තොට දිස්ත්‍රික්කය
   - අංක 01 - කටුවන
   - අංක 02 - කසාගල
   - අංක 03 - හම්බන්තොට
   - අංක 04 - තිස්සමහාරාමය

5.	උතුරු පළාත -	• අංක 01	-	යාපනය
	යාපනය/ කිලිනොච්චි දිස්ත්‍රික්ක	• අංක 02	-	දුපත්
		• අංක 03	-	වලිකාමම්
		• අංක 04	-	වඩමාරච්චි
		• අංක 05	-	තෙන්වාරච්චි
		• අංක 06	-	කිලිනොච්චි
6.	උතුරු පළාත -	• අංක 01	-	වවුනියාව
	මන්නාරම්/ මුලතිව්/ වවනියා දිස්ත්‍රික්ක	• අංක 02	-	මුලතිව්
		• අංක 03	-	මන්නාරම
7.	වයඹ පළාත	• අංක 01	-	පුත්තලම
	කුරුණෑගල / පුත්තලම දිස්ත්‍රික්ක	• අංක 02	-	නෝනිගල
		• අංක 03	-	හලාවත
		• අංක 04	-	යාපහුව 01
		• අංක 05		යාපහුව 02
		• අංක 06	-	අරන්කැලේ
		• අංක 07	-	කුරුණෑගල
		• අංක 08	-	පඬුවස්නුවර
		• අංක 09	-	දඹදෙණිය
		• අංක 10	-	හස්තිකුච්චි
8.	උතුරුමැද පළාත	• අංක 01	-	පදවිය
	අනුරාධපුර දිස්ත්‍රික්කය	• අංක 02	-	කිරලාගල
		• අංක 03	-	මිහින්තලය
		• අංක 04	-	නැගෙනහිර නුවර ගම් පළාත
		• අංක 05	-	පුජා නගරය
		• අංක 06	-	තන්නිරිමලය
		• අංක 07	-	මානාකන්ද
		• අංක 08		රිටිගල
		• අංක 09	-	උපුල්වෙහෙර
		• අංක 10	-	මැදවච්චිය
		• අංක 11	-	තඹුත්තේගම

		• අංක 12	-	නොච්චියාගම
		• අංක 13	-	ඇතුල්නුවර
9.	උතුරුමැද පළාත	• අංක 01	-	පොළොන්නරුව
	පොළොන්නරුව දිස්ත්‍රික්කය	• අංක 02	-	මැදිරිගිරිය
		• අංක 03	-	නාමල්පොකුණ
10.	ඌව පළාත	• අංක 01	-	නාගදීපය
	බදුල්ල දිස්ත්‍රික්කය	• අංක 02	-	බදුල්ල
		• අංක 03	-	දියතලාව
		• අංක 04	-	පස්සර
11.	ඌව පළාත	• අංක 01	-	ගලබැද්ද
	මොණරාගල දිස්ත්‍රික්කය	• අංක 02	-	මාළිගාවිල
		• අංක 03	-	බිබිල
		• අංක 04	-	බුදුරුවගල
12.	සබරගමුව පළාත	• අංක 01	-	දනගිරිගල
	කෑගල්ල දිස්ත්‍රික්කය	• අංක 02	-	දැලිවල
		• අංක 03	-	කෑගල්ල
		• අංක 04	-	සීතාවක
13.	සබරගමුව පළාත	• අංක 01	-	රත්නපුර
	රත්නපුර දිස්ත්‍රික්කය	• අංක 02	-	මඩුවන්වෙල
		• අංක 03	-	බුදුගල
14.	නැගෙනහිර පළාත	• අංක 01	-	පදියදොර
	අම්පාර/ මඩකලපුව දිස්ත්‍රික්ක	• අංක 02	-	ඔවාගිරිය
		• අංක 03	-	දිසවාපිය
		• අංක 04	-	සමන්තුරේ
		• අංක 05	-	ලාහුගල
15.	නැගෙනහිර පළාත	• අංක 01	-	ගෝමරන්කඩවල
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	• අංක 02	-	ත්‍රිකුණාමලය
		• අංක 03	-	සේරුවිල

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

❖ **2021 වර්ෂය සඳහා වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2021.12.31 දිනට)**

		ප්‍රතිපාදන (රු.මි.)		ප්‍රගතිය (රු.මි.)	
		මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන
වැඩසටහන 01	207 - 01 - 01	13.000	281.650	10.087	232.773
වැඩසටහන 02	207 - 02 - 02	248.900	971.650	110.332	767.823
		261.900	**1,253.300**	**120.419**	**1,000.596**
				46%	**80%**

❖ **2021 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් වෙන්කර ඇති ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2021.12.31 දිනට)**

වර්ෂය	ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රගතිය	
2017	232.945	170.111	73%
2018	370.706	69.586	19%
2019	344.896	43.936	13%
2020	-	-	-
2021	-	-	-

❖ **2021 වර්ෂය සඳහා බාහිර ආයතන ආධාර මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2021.12.31 දිනට)**

වර්ෂය	ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රගතිය	
2018	48.304	6.832	14%
2019	68.799	2.597	4%
2020	39.557	11.136	28%
2021	10.479	3.642	35%

සටහන:- මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන සහ බාහිර ආයතන ආධාර මඟින් ලබාදෙන ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහාද ක්‍රියාත්මක වේ.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

1. අ) ව්‍යාපෘතියේ නම :- රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංවර්ධනය

   ආ) දායක නියෝජිතයාතනය :- ඇමරිකානු අරමුදල

   ඇ) ව්‍යාපෘති ඇස්තමේන්තු ගත වියදම :- (ව්‍යාපෘතියේ කළමණාකරන හා නඩත්තු කටයුතු පමණක් ඇමතිතුමාගේ උපදෙස් පරිදි සිදු විය)

   ඈ) ව්‍යාපෘති කාල සීමාව :- 2017 – 2022

02.පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජගුහන, අභියෝග හා ඉදිරි ඉලක්ක

2021 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන් වූ භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදන අනුව පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණ හා ලේඛනගත කිරීම්, කැණීම්, අභිලේඛන හා නාණක විද්‍යා / පර්යේෂණ, සංරක්ෂණ හා නඩත්තු, මහජන ප්‍රදර්ශන හා ප්‍රවර්ධන වැඩසටහන් සහ විශේෂ ව්‍යාපෘති වූ රජගලතැන්න හා රිටිගල පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම ඇතුළත්ව පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සංඛ්‍යාව 398 ක් විය.

දෙවන වසරටත් බලපෑම් ඇති කළ Covid – 19 වසංගතය හේතුවෙන් උද්ගත වූ තත්ත්වය මත 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් වැඩ අවසන් කිරීමට හැකි වූ ව්‍යාපෘති සංඛ්‍යාව 274 ක් පමණ විය. ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක ආරම්භ කටයුතු පමාවීම, සංචරණ සීමා ක්‍රියාත්මක වූ කාලපරිච්ඡේදය තුළ තත්කාර්ය සේවකයින් වැඩබිම් පරිශ්‍රය වෙත ගෙන්වා ගැනීමට අපහසු වීම, ඉදිකිරීම් ක්ෂේත්‍රයට අයත් සිමෙන්ති, යකඩ මෙන්ම අනෙකුත් ද්‍රව්‍ය සඳහා පැවති ඉහළ මිල ගණන් හා එම ද්‍රව්‍යන්ගේ සැපයුම සීමාසහිත වීම තුළින් සිදු කරන ලද වැඩ ප්‍රමාණයන් අඩු වීම, අහිතකර මුල්‍ය වාතාවරණය මත මුල්‍ය ප්‍රතිපාදන සීමා කිරීම සහ නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සීමා වීම මෙම තත්ත්වයට සාධනීය ලෙස බලපාන ලද ප්‍රධාන සාධක අතර විය. මේ අනුව 2021 වර්ෂයේ මූලධන ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය 64% ක් වූ අතර, මුලධන වියදම රුපියල් මිලියන 120.419 ක් විය. 2021 වර්ෂයේ මුල්‍ය වැය කිරීම් පහත සංඛ්‍යා සටහන මඟින් දක්වා ඇත.

වැඩ සටහන් අනුව 2021 වර්ෂය සඳහා වෙන් කර ඇති මුල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය

වැඩසටහන	වැය විස්තරය	වෙන් කරන ලද ප්‍රතිපාදන		නත්‍ය වියදම රු.මිලියන	මුල්‍ය ප්‍රගතිය (%)
		මුල් ප්‍රතිපාදන රු.මිලියන	අවසාන ප්‍රතිපාදන රු.මිලියන*		
වැඩ සටහන 01 207-01-01	පුනරාවර්තන වියදම්	281.650	281.650	232.773	83%
සාමාන්‍ය පරිපාලනය	මූලධන වියදම්	13.000	13.000	10.087	78%
	උප එකතුව	294.650	294.650	242.860	82%
වැඩ සටහන 02 207-02-02	පුනරාවර්තන වියදම්	971.650	971.650	767.8233	79%
පුරාවිද්‍යා සේවය	මූලධන වියදම්	248.900	175.948	110.332	63%
	උප එකතුව	1,220.550	1,147.598	878.155	77%
මුළු මුල්‍ය ප්‍රතිපාදන	**පුනරාවර්තන වියදම්**	**1,253.300**	**1,253.300**	**1,000.597**	**80%**
	මූලධන වියදම්	**261.900**	**188.948**	**120.419**	**64%**
	මුළු එකතුව	**1,515.200**	**1,442.248**	**1,121.016**	**78%**

* 2021.08.28 දිනැති ලිපියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව 2021.09.15 දින භාණ්ඩාගාරයට යවන ලද මුදල වන රු. මිලියන 72.952 අඩු කිරීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදන

පුනරාවර්තන වියදම රුපියල් මිලියන 1,000.597 ක් හා එහි මුල්‍ය ප්‍රගතිය 80% ක් ද, සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රුපියල් මිලියන 1,121.016 ක් ලෙස වාර්තා කරමින් සමස්ත මුල්‍ය කාර්යසාධනය 78% ක් විය.



2021 වර්ෂය සඳහා වෙන් කර ඇති මූලධන ප්‍රතිපාදන සහ ප්‍රගතිය

වැය විෂය	අයිතම විස්තරය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		ඇස්තමේන්තු ගත ව්‍යාපෘති ගණන	වැඩ අවසන් ව්‍යාපෘති	නත්‍ය වියදම් (රුපියල්)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
		මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය *					
207-01-01-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2,000,000.00	2,000,000.00	6	6	973,664.71	49%	100%
207-02-02-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	4,000,000.00	4,000,000.00	11	3	3,359,000.27	84%	75%
207 - 01 - 01 207 - 02 - 02	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	3,900,000.00	3,900,000.00			2,537,432.06	65%	
207 - 01 - 01 207 - 02 - 02	මූලධන වත්කම් අත්පත් කරගැනීම	11,500,000.00	11,500,000.00			11,415,674.11	99%	
207 - 01 - 01 - 2401 207 - 02 - 02 - 2401	කාර්ය මණ්ඩල පුහුණු	2,500,000.00	2,500,000.00			1,429,065.26	57%	70%
207-02-02-2509 (8)	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණ , කැණීම්, අභිලේඛන හා නාණක කටයුතු, පර්යේෂණ	18,000,000.00	18,000,000.00	80	74	14,423,497.65	80%	92%
207-02-02-2509 (9)	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කිරීම	150,000,000.00	94,146,000.00	210	130	56,754,185.26	60%	81%
207-02-02-2509 (10)	පුරාවිද්‍යා ස්ථානවල කෞතුකාගාර පවත්වා ගෙන යාම හා ප්‍රවර්ධන කටයුතු	12,000,000.00	12,000,000.00	75	58	11,419,063.55	95%	95%
207-02-02-2001 (5) 207-02-02-2509 (5)	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය	53,000,000.00	35,890,000.00	1		14,162,714.05	39%	76%
207-02-02-2509 (12)	රිටිගල පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය	3,000,000.00	3,000,000.00	1		1,997,218.00	67%	90%
207-02-02-2509 (15)	කන්නියා උණු වතුර ළිං නඩත්තු කිරීම	2,000,000.00	2,000,000.00	1	1	1,948,150.84	97%	100%
	මුළු එකතුව	**261,900,000.00**	**188,936,000.00**	**385**	**272**	**120,419,665.60**	**64%**	**87%**
* 2021.08.28 දිනැති ලිපියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව 2021.09.15 දින භාණ්ඩාගාරයට යවන ලද මුදල් වන රු.මිලියන 72.964 අඩු කිරීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදන								
207 - 01- 01-1303 207- 02 - 02-1303	පුනරාවර්තන වියදම් - ගොඩනැගිලි සහ ඉදිකිරීම්	9,500,000.00	8,500,000.00	13	2	4,545,990.50	53%	54%

ගවේෂණ හා ලේඛනගත කිරීම්

පුරාවිද්‍යා රක්ෂිත හා ආරක්ෂිත ස්මාරක ප්‍රකාශයට පත්කිරීම, පුරාවිද්‍යා ස්ථානවල මායිම් නිරවුල් කිරීම, වංචල පුරාවස්තු ලේඛනගත කිරීම, ඊ හෙරිටේජ් ව්‍යාපෘතිය 2 අදියර හා GIS අන්තර්ජාල බිහිදොර යාවත්කාලින කිරීම හා තොරතුරු එක්රැස් කිරීම, පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම සඳහා තොරතුරු රැස්කිරීම, ස්ථාන පරික්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු, මූලික ගවේෂණ කටයුතු සිදු කිරීම හා අවසන් ශාස්ත්‍රීය වාර්තා සැකසීම ඇතුළත්ව ගවේෂණ හා ලේඛනගත කිරීම් යටතේ ව්‍යාපෘති 53 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කළ අතර, එම ව්‍යාපෘතිවල 100% අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට හැකි විය.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාපෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
ගවේෂණ හා ලේඛනගත කිරීම්	11,50,000.00	53	53	11,327,877.44	99%	100%

වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්,



පුරාවිද්‍යා ස්ථානවල මායිම් නිරවුල් කිරීම (වයඹ පළාත)





මඩකලපුව මායිම් කණු යෙදීම

හෙරිටේජ් ව්‍යාපෘතියේ අදියර - 02







මුරංගාගල, මාවරගල පුරාවිද්‍යා භූමි ගවේෂණය



ස්ථාන පරික්ෂාව සහ ක්ෂේත්‍ර කටයුතු (සියළුම දිස්ත්‍රික්ක)



හම්බන්තොට දිස්ත්‍රික්කය



අම්පාර දිස්ත්‍රික්කය



වංචල පුරාවස්තු ලේඛන ගත කිරීම - බදුල්ල දිස්ත්‍රික්කය



නාගොල්ල පුරාවිද්‍යා ස්ථානයේ තදාශ්‍රිත ප්‍රදේශයේ ගවේෂණය

කැණීම්

කැණීම් අංශය යටතේ කැණීම් ස්ථාන පරීක්ෂාව හා කැණීම් වාර්තා මුද්‍රණය, යාපහුව පර්යේෂණ කැණීම් ව්‍යාපෘතිය - III අදියර, කුරුණෑගල පර්යේෂණ කැණීම් ව්‍යාපෘතිය - II අදියර, දඹදෙණිය පර්යේෂණ කැණීම II අදියර, හිරිවඩුන්න පුරාවිද්‍යා ස්ථානය කැණීම, සෝමාවතිය පුරාවිද්‍යා ස්ථානයේ ස්තූප ආශ්‍රිත පර්යේෂණ කැණීම, දීඝවාපිය පුරාවිද්‍යා ස්ථානයේ ස්තූප මළුව කැණීම හා දීඝවාපිය පුරාවිද්‍යා ස්ථානය කැණීමෙන් ලද අහුරු නියදි කාලනිර්ණය ඇතුළත්ව කැණීම් ව්‍යාපෘති 10 ක් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, පැවති වසංගත තත්ත්වය මත වැඩ අවසන් කිරීමට හැකි වූ ව්‍යාපෘති සංඛ්‍යාව 4 ක් විය. ඩොලර් හිඟ වීම හේතුවෙන් වැඩි මුදලක් ගෙවීමට සිදුවන බැවින්, කාලනිර්ණ කටයුතු සඳහා අදාළ ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීමට සිදු විය.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාපෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
කැණීම්	5,338,900.00	10	4	1,977,653.62	37%	75%

වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්,



දීඝවාපි මළුව කැණීම



යාපහුව පර්යේෂණ කැණීම





දඹදෙණිය පර්යේෂණ කැණීම් ව්‍යාපෘතිය අදියර - I





හිරිවඩුන්න පුරාවිද්‍යා ස්ථානය කැණීම





කුරුන්දි පබ්බත විහාරය කැණීම



අභිලේඛන හා නාණක විද්‍යා

අභිලේඛන හා නාණක විද්‍යා යටතේ ශිලාලේඛන පරිවර්තන නාම පුවරු 50 ක් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීම, අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම, කාසි සුවිගත කිරීම, ප්‍රාදේශීය කාර්යාලවල සෙල්ලිපි ස්ථාන පරික්ෂාව, ගම්පහ දිස්ත්‍රික්කයේ සෙල්ලිපි නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම, දිවයින පුරා නව ශිලාලේඛන පිටපත් කිරීම හා පර්යේෂණ සඳහා ශිලාලේඛන නැවත පිටපත් කිරීමේ ව්‍යාපෘතිය ඇතුළත්ව ව්‍යාපෘති 17 ක් 2021 වසර තුළ ක්‍රියාත්මක කරන ලද අතර, 100% ක අපේක්ෂිත කාර්යසාධනයක් ලභා කර ගැනීමට හැකි විය.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
අභිලේඛන හා නාණක විද්‍යා	1,161,100	17	17	1,088,746	94%	100%

වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්,



කාසි සුවිගත කිරීම (අනුරාධපුර කෞතුකාගාරය)



පරිවර්තන නාම පුවරු 50 ක් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීම

මඩකලපුව පුලුටුමානෝඩ ශිලාලේඛන පිටපත් කිරීම





ප්‍රාදේශීය කාර්යාලවල සෙල්ලිපි ස්ථාන පරික්ෂා කිරීම



අනුරාධපුර



කුරුනෑගල - කොටදෙණියාව



අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත්කිරීම

වාස්තු විද්‍යා සංරක්ෂණ

දීඝවාපිය, නීලගිරිය වැනි විශාල දාගැබ් මෙන්ම මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ දාගැබ් ද, විහාරස්ථාන, සංඝාවාස, පිළිමගෙවල්, කෝවිල, අම්බලම්, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ඇතුළත්ව ව්‍යාපෘති 32 ක් වාස්තු විද්‍යා සංරක්ෂණ යටතේ දිස්ත්‍රික් මට්ටමින් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අයත් සිමෙන්ති, යකඩ මෙන්ම අනෙකුත් ද්‍රව්‍යවල මිල සීඝ්‍රයෙන් ඉහළයාමත් එම ද්‍රව්‍යවල සැපයුම සීමාසහිත වීම මත 2021 වසර සඳහා ප්‍රතිපාදන වෙන් වූ බොහොමයක් ව්‍යාපෘතිවල අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට ළඟා වීමට අපොහොසත් විය. ගඩලාදෙනිය විහාරයේ වහල නිර්මාණය සඳහා කැබිනට් අනුමැතිය නොලබීම හේතුවෙන් ඒ සඳහා වෙන්වූ රුපියල් මිලියන 16.870 පමණ ප්‍රතිපාදන වැය කිරීම සිදු නොකරන ලදි. වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක් පහත දක්වා ඇත.

අංශය	මුල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මුල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
වාස්තු විද්‍යා අංශය	54,154,000.00	32	13	24,154,948.19	45%	71%



කඩුවෙල සංඝපිටිය විහාරය - පිළිමගෙය සංරක්ෂණය



කඳුරු වැව පුරාවිද්‍යා ස්ථානය - පේසාව හා මළුව සංරක්ෂණය



අරඹේගම සංඝාවාසය සංරක්ෂණය



තෙලිකඩ සුනන්දාරාමයේ වහළ සංරක්ෂණය



සෝනුත්තර දාගැබ සංරක්ෂණය



දීඝවාපී පුරාවිද්‍යා ස්ථානය - ස්තූප සංරක්ෂණය



නීලගිරිය පුරාවිද්‍යා ස්ථානය - ස්තූප සංරක්ෂණය



එප්පාවල පොත්ගුල් විහාරය චෛත්‍ය සංරක්ෂණය



යාපහුව ශෛලමය ප්‍රාකාර බැම්ම සංරක්ෂණය



බිහල්පොල විහාරයේ ස්තූපය සහ ප්‍රාකාරයේ කොටසක් සංරක්ෂණය



කෙහෙල්ඇල්ල අම්බලම සංරක්ෂණය



විහාරේගම පැරණි ස්තූපය ප්‍රතිසංස්කරණය

❖ රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතිය

බන්දා පොකුණ සංරක්ෂණ ව්‍යාපෘතියේ බටහිර බැම්ම දිග අඩි 100 පදනම දැමීම සහ 11 වන වරියේ අඩි 50 ක් පමණ පඩි ගල් දැමීම 2021 වසරේ සිදු කරන ලදි. සිමෙන්ති මිල සීඝ්‍රයෙන් ඉහළ යාම හා සිමෙන්ති සැපයුමේ පැවති හිඟතාවය හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නතර කිරීමට සිදුවිය.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
රිටිගල පුරාවිද්‍යා ස්ථානය	3,000,000.00	1	1	1,997,218.00	67%	90%





සංරක්ෂණ කටයුතු අතරතුර

❖ රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතිය

2021 වසරේ ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවවීම හේතුවෙන් කළමනාකරණ හා නඩත්තු කටයුතු පවත්වා ගෙන යාම පමණක් 2021 වර්ෂයේ සිදු විය.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
රජගල පුරාවිද්‍යා ස්ථානය	35,890,000.00	1		14,162,714.05	39%	76%

❖ කන්නියා උණු වතුර ළිං නඩත්තු කිරීම

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.	2,000,000.00	1	1	1,948,150.84	97%	100%

රසායන සංරක්ෂණ

සිතුවම් හා මූර්ති සංරක්ෂණ ව්‍යාපෘති 32 ක් රසායන සංරක්ෂණ යටතේ වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, එම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 23 ක 100% ක අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීමට හැකි විය.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
රසායන සංරක්ෂණ	3,881,000.00	32	23	2,690,830.93	69%	88%

වසර තුළ ක්‍රියාත්මක කරන ලද සිතුවම් හා මූර්ති සංරක්ෂණ ව්‍යාපෘති කිහිපයක්,



ගණේතැන්න රජමහ විහාරය



මැටිකොටුමුල්ල ටැම්පිට විහාරය



කලුපේ නාගරුක්ඛාරාම විහාරය



පඹුරන වාලුකාරාම විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය



රක්ඛිතාකන්ද විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය



අම්පිටිය කණවැරැල්ල විහාරය



මයුගිරිය ලෙන් විහාරයේ සිතුවම් සංරක්ෂණය



වඳුරඹ පල්ලියගොඩ විහාරයේ සිතුවම් සංරක්ෂණය



මුජ්පනේ රජමහා විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය

නඩත්තු අංශය

පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ කලාප පවත්වා ගෙන යාම ඇතුළත්ව නඩත්තු ව්‍යාපෘති 176 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි. 2021 වසර සඳහා ප්‍රතිපාදන වෙන් වූ බොහොමයක් ව්‍යාපෘති සඳහා සිමෙන්ති හා යකඩවල මිල සීඝ්‍රයෙන් ඉහළ යාමත් ඒවායේ සැපයුම සීමා සහිත වීම හා පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීමට නොහැකි වූ අතර, වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව 94 ක් පමණ විය. වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් කිහිපයක් පහත දක්වා ඇත.

අංශය	මුල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යෘති ගණන	වැඩ අවසන්	මුල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
207-02-02-2509 (9)	36,120,000.00	146	94	28,265,491.85	78%	85%
207-01-01-2001	2,000,000.00	6	6	973,664.71	49%	100%
207-02-02-2001	4,000,000.00	11	3	3,359,000.27	84%	75%
207 - 01 / 02 (1303)	8,500,000.00	13	2	4,545,990.50	53%	54%



සීලවති පබ්බත විහාරය නඩත්තුව





කලාප පවත්වා ගෙන යාම



වාවින්න ගුරුකැටේ විහාරයේ ස්තූප නඩත්තුව





දෙමටමල් විහාරයේ ස්තූප හා ඒ ආශ්‍රිත මළුව නඩත්තුව



සෙල්ලබා දාගැබ පොයින්ට් කිරීම



වෙහෙරබැදිකැලේ පැරණි දාගැබ ගොඩැල්ල තෘණ ඉවත් කර බාදනය වලක්වා ආරක්ෂාව තහවුරු කිරීම



අම්පාර මායිම් කණු යෙදීම

ප්‍රවර්ධන අංශය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරෙන කාර්යයන් පිළිබඳ මහජනතාවට අවබෝධයක් ලබා දීම හා පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සඳහා මහජන අවබෝධය ලබාදීමේ අරමුණින් විවිධ කාර්යයන් ප්‍රවර්ධන අංශය මඟින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි.

අංශය	මුල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මුල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
ප්‍රවර්ධන අංශය	7,900,000.00	37	25	7,364,192.80	93%	90%

❖ ජාතික පුරාවිද්‍යා සමුළුව

ජාතික පුරාවිද්‍යා සමුළුවට සමගාමීව පුරා දෙසතියක් ක්‍රියාවට නංවමින් ජාතික පුරාවිද්‍යා දින නිල උත්සවය අරලියගහ මණ්ඩිරයේ දී ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ පර්යේෂණයන් ඉදිරිපත් කරමින් මෙවර පුරාවිද්‍යා සමුළුව මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු වූ අතර, එම පත්‍රිකා ඇතුළත් සමුළු ප්‍රකාශනය මුද්‍රණය සඳහා සකස් කෙරිණි. එයට සමගාමීව මාර්ගගත ක්‍රමය ඔස්සේ පුරාවිද්‍යා විද්වතුන් පුරාවිද්‍යා දේශන පැවැත්වීම, පුරාවිද්‍යා ගීතය නිර්මාණය ආදිය සිදු කෙරිණි.





❖ පුරාවිද්‍යා දෙසතියේ විශේෂ වැඩසටහන් පැවැත්වීම

ජාතික පුරාවිද්‍යා දෙසතියට සමගාමීව ලංකාව පුරා පිහිටි ප්‍රාදේශිය පුරාවිද්‍යා කාර්යාල 15 ක් ආශ්‍රිතව විවිධ පුරාවිද්‍යා කාර්යයන් සිදු කෙරිණි. දැනුවත් කිරීමේ කාර්යයන්, සංරක්ෂණ නඩත්තු කටයුතු, ඔසු උයන් පිහිටුවීම, අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා දීම, පුවරු සවි කිරීම හා පිහිටුවීම ආදී කාර්යයන් ප්‍රමුඛ විය. මේ තුළින් මහජනතාව පුරාවිද්‍යා උරුමය පිළිබඳව දැනුවත් කිරීම මූලික අභිලාෂය විය.







ඔසු උයන් ආරම්භ කිරීම

❖ පුරාවිද්‍යා ග්‍රන්ථ මුද්‍රණය

පුරාවිද්‍යා පර්යේෂණයන් ආශ්‍රයෙන් මහජන අවබෝධය පෙරටු කර ගනිමින් ග්‍රන්ථ කිහිපයක් සකස් කෙරිණි. පාසැල් ළමුන් සඳහා පුරාවිද්‍යා උරුමය පිළිබඳ අමතර පොත් පහක්, දඹේගොඩ බෝධිසත්ව ප්‍රතිමාව, මාතර තාරකා කොටුව, අපේ උරුමය ඇසින් - බුදු පිළිමය හා බෝධිසත්ව, පුරාවිද්‍යා උරුමය පිළිබඳ චිත්‍රකතා පොත, Ancient Ceylon – 27 යන යන ග්‍රන්ථ සකස් කෙරිණි. භූපති, The Past ඉංග්‍රීසි සඟරාව සකස් කිරීම හා Archaeology News Letter අන්තර්ජාලය ඔස්සේ ප්‍රකාශයට පත් කෙරිණි.









❖ පුරාවිද්‍යා දේශන

පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම හා උරුමය පිළිබඳ අවබෝධය ලබා දීමේ අරමුණින් යුතුව පාසැල් සිසුන්, දහම් පාසැල් සිසුන්, ගුරුවරුන්, මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා භික්ෂූන් වහන්සේලා යන පිරිස් සඳහා දේශන 15 ක් සිදු කොට ඇත. ඇතැම් දේශන පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබූ නමුත් කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.




❖ පුහුණු වැඩමුළු

පුහුණු පාඨමාලාවන්ට සහභාගිත්වය හා පුහුණු කටයුතු සිදු කිරීම යන දෙඅංශයෙන්ම කාර්යයන් සිදු කෙරිණි. පාෂාණ සංරක්ෂණ වැඩමුළුව, ආකල්ප ප්‍රවර්ධන වැඩ සටහන, Zoom තාක්ෂණය ඔස්සේ දෙපාර්තමේන්තු පුහුණු පැවැත්වීම හා පුරාවස්තු විනාශය වැළැක්වීමේ පුහුණු වැඩමුළු ඒ අතර විය. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා පැවැත් වූ තරහ විභාග සඳහා විභාග දෙපාර්තමේන්තුවට ගෙවීම් කටයුතු සිදු කෙරිණි.

කෞතුකාගාර අංශය

කෞතුකාගාර 28 ක් පවත්වාගෙන යාම, අධීක්ෂණය හා ස්ථාන පරීක්ෂාව, කෞතුකාගාර ප්‍රතිසංවිධාන කටයුතු, තොරතුරු මධ්‍යස්ථානය පිහිටු වීම හා ශාස්ත්‍රීය ප්‍රවර්ධන අත්පත්‍රිකා මුද්‍රණය කිරීම ඇතුළත්ව ව්‍යාපෘති 37 ක් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.

අංශය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාපෘති ගණන	වැඩ අවසන්	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
කෞතුකාගාර අංශය	3,500,000.00	37	32	2,969,443.97	85%	96%

වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්,

❖ **කෞතුකාගාරවල ප්‍රදර්ශන අඩුපාඩු සැකසීම**




අනුරාධපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශන අඩුපාඩු සැකසීම




යාපනය කෞතුකාගාරයේ විදුලි පද්ධතියේ අඩුපාඩු සැකසීම

❖ **කෝට්ටේ කෞතුකාගාරයේ දෙවන මැදිරිය ප්‍රතිසංවිධානය**

නරඹන්නාගේ දැනුම අවබෝධය හා ආශ්වාදය ලබා ගැනීමේ අරමුණ ඇතිව මෙම ප්‍රතිසංවිධාන කටයුතු සිදු කරන ලදි.




❖ **පනාවිටිය තොරතුරු මධ්‍යස්ථානය විවෘත**

131 වන ජාතික පුරාවිද්‍යා දිනයට සමගාමීව ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා අතින් මෙම තොරතුරු මධ්‍යස්ථානය 2021.07.02 වන දින මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදි.





❖ **මහනුවර කෞතුකාගාරයේ ශාස්ත්‍රීය හා ප්‍රවර්ධනය (අත්පත්‍රිකා මුද්‍රණය කිරීම)**

රජවාසල ගොඩනැගිල්ල උපරි ව්‍යුහය සහිත මෙරට එකම රජමාලිගාව වේ. කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන නරඹන්නන් දැඩි ප්‍රසාදයකින් යුතුව ඒ පිළිබඳව අදහස් පල කරන බැවින් සියලුම නරඹන්නන් සඳහා සුදුසු වන පරිදි සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකෙන්ම අත්පත්‍රිකා සකස් කර මුද්‍රණය කරන ලදි.




❖ කෞතුකාගාර පවත්වා ගෙන යාම (සියළුම දිස්ත්‍රික්ක)

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාර හා තොරතුරු මධ්‍යස්ථාන 28 ක් වර්ෂය පුරා මහජන ආකර්ෂණය හා සිතගන්නා සුළු ආකාරයෙන් කෞතුකාගාරයේ ප්‍රදර්ශන කටයුතු නඩත්තු කර පවත්වා ගෙන යාම.



මාතර තාරකා කොටුව කෞතුකාගාරය පවත්වා ගෙන යාම



නාලන්දා කෞතුකාගාරය පවත්වා ගෙන යාම



අනුරාධපුර කෞතුකාගාරය පවත්වා ගෙන යාම

❖ කෞතුක වස්තු භාර ගැනීම

වල්පොල, රාගම ශෂිකා ආදලි මහත්මියගේ ගෙවත්තේ මඤ්ඤොක්කා වගාවෙහි අස්වනු නෙලන අවස්ථාවේ දී පොළව මතුපිට සිට අඩි එකහමාරක් පමණ අභ්‍යන්තරයෙන් හමු වී ඇත. තඹ මුට්ටියක් තුළ ලීලාවති රැජිණ, සහස්සමල්ල, විජයබාහු රාජ්‍ය සමයට අයත් කාසි, පරාක්‍රමබාහු රාජ්‍ය සමයට අයත් කාසි, බුවනෙකබාහු රජ සමයට අයත් කාසි ඇතුළු කාසි 1,139 හමු වී ඇති අතර, එම සියලු කාසි රාගම පොලිස් භාරයේ තිබී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර අංශය විසින් විධිමත්ව භාර ගන්නා ලදි.

මාධ්‍ය අංශය

අංශය	මුල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වැය සටහන් කරන ලද ව්‍යාෘති ගණන	වැඩ අවසන්	මුල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය (%)
				රුපියල්	%	
මාධ්‍ය ඒකකය	600,000.00	1	1	465,000.00	78%	100%



දායාද පුරාවිද්‍යා පුවත් අටුවාව 14 වන කලාපය මුද්‍රණය කිරීම

අභියෝග හා ඉදිරි දැක්ම

උරුම සංරක්ෂණයේ අරමුණ වන්නේ අතීත උරුමයට වර්තමාන ප්‍රජාවගෙන් එල්ලවන අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කර ගනිමින් අනාගතය වෙත භාර දීමේ අපේක්ෂාවයි. ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමය ආරක්ෂා කර ගනිමින් කෙටිකාලීන හා මධ්‍ය කාලීන නියමු සැලසුම් මඟින් හඳුනා ගන්නා වැඩසටහන් තුළින් **"පුරාවිද්‍යා ස්ථාන ප්‍රසස්ථ මට්ටමට ගැනීම", "විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම"** සහ **"සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනාලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම"** දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම සහ අරමුණු අතර ප්‍රධාන වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට යාමේදී දෙපාර්තමේන්තුවට අභියෝගයන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවේ.

- සංස්කෘතික උරුම ක්ෂේත්‍ර, වර්ධනය වන ජනගහණය සහ භූමි පරිභෝජන රටාවන් අතර සීමිත අවකාශය සඳහා වන තරඟයේදී මුහුණ දීමට සිදු වී ඇති ගැටළු. නෛතික රාමුව තුළ පවතින ඉඩකඩ සීමිත බැවින් ජීවමාන සංස්කෘතීන් පවත්වාගෙන යාමේ දී පැනනඟින ප්‍රායෝගික ගැටළු නිරාකරණය කිරීමට නොහැකි වීම සහ ගැසට් කරනු ලබන පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්මාරක හා රක්ෂිතයන්හි මැනුම් කටයුතු සිදු කිරීමේ අපහසුතාවයක් පැවැතීම.
- පුරාවස්තු විනාශයන් පිළිබඳව පරීක්ෂා කිරීමේ ගැටළු.
- ආරක්ෂක ක්‍රමවේදයේ පවතින දුර්වලතා.
- ජීවමාන පුරාකෘති පවත්වාගෙන යාමේ ගැටළු.
- ආගමික ස්ථාන පවත්වාගෙන යාමේ දී ඇතිවන සංස්කෘතික ගැටළු.
- මිතව්‍යාමත සහ නොදැනුවත් බව නිසා ඇතිවන අනවසර කැණීම්.
- සංවර්ධන යෝජනා සඳහා වන හානි ඇගයීම් වාර්තා ලබා දීමේ ගැටළු.
- බනිජ නිස්සාරණ බලපත්‍ර ලබා දීමේ ගැටළු.
- උරුමය සහ ප්‍රජාව අතර සබඳතාව දුරස්වීම මත දිගුකාලීනව ක්ෂේත්‍රයේ පැවැත්මට අභියෝග එල්ල වීමට ඇති ප්‍රවනතාවය, මේ හේතුවෙන් පුරාවස්තූන් සොරසතුරු උවදුරුවලට ලක්වීම සහ පුරාවස්තු සහ ස්මාරකයන්ගේ පැවැත්මට සිදුවන හානිය දිනෙන් දින ඉහළ යාම.
- තිරණ ගැනීමේ ක්‍රියාවලියට බද්ධ වීම සඳහා ප්‍රජාව සතු දැනුමේ සහ හැකියාවේ අවම දාරිතාව සහ මැදිහත්වීම සම්බන්ධයෙන් පවතින නීතිමය ගැටළු.
- ආයතනමය දාරිතාවේ පවතින ගැටළු, එනම් මූල්‍ය සහ භෞතික සම්පත්වල හිඟකම, විශේෂඥ දැනුමේ සාපේක්ෂ හිඟය, අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, ඉතා කඩිනමින් සිදු කළ යුතු සංවර්ධන තත්ත්වයන් සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමේ දී පවතින ප්‍රායෝගික ගැටළු මෙහිදී සැලකිය යුතු වේ.

2.2 ඉදිරියේදී ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

1. උරුම සංරක්ෂණ ක්‍රියාදාමය සඳහා ප්‍රජාව මැදිහත් වීම, දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය.
   පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරෙන කාර්යයන් පිළිබඳ මහජනතාවට අවබෝධයක් ලබා දීම හා පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සඳහා මහජන අවබෝධය ලබා දීමේ අරමුණින් විවිධ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම.
2. පුරාවිද්‍යා ස්ථාන නියමු සැලසුම් තුළ හඳුනා ගෙන ඇති වැඩසටහන් තුළින් ප්‍රශස්ත මට්ටමට ගැනීම.
3. වානිජ මට්ටමින් සිදුවන පුරාවස්තු සොරම් කිරීම්, පුරාවස්තු විනාශය වැළැක්වීම සහ ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කිරීමට කටයුතු කිරීම.
4. පුරාවිද්‍යා රක්ෂිත හා ආරක්ෂිත ස්මාරක හඳුනා ගෙන ගැසට් කිරීමට කටයුතු කිරීම සහ උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස්කිරීම.
5. හඳුනා ගන්නා නව පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේෂණය සහ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, එහි ප්‍රතිඵලයන් ප්‍රකාශයට පත් කිරීම.
6. පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය / නඩත්තු කර පවත්වාගෙන යාම, පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වාගෙන යාම,
7. යටිතල පහසුකම් ප්‍රවර්ධනය (ප්‍රධාන කාර්යාලය / ප්‍රාදේශීය කාර්යාල / සංචාරක බංගලා)
8. ඓතිහාසික පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් උදෙසා සනීපාරක්ෂක හා යටිතල පහසුකම් පුරාවිද්‍යා ස්ථානවලට හානියක් නොවන පරිදි ප්‍රමාණාත්මකව වැඩි දියුණු කිරීම.
9. නඩත්තු ව්‍යාපෘතිවල කාර්යය සාධනය වැඩි කර ගැනීම සඳහා දිගුකාලීන හා කෙටි කාලීන වශයෙන් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.
   - නඩත්තු අංශය සඳහා ලබා දෙන ප්‍රතිපාදන වැඩි කිරීම.
   - සංචාරක බංගලාවල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට වැය ශීර්ෂයක් ඇති කිරීම.
   - පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කර නඩත්තු කිරීම සඳහා කටයුතු කරන කලාප භාර නිලධාරීන්ට හා රැකවල් කරුවන් සඳහා ඉන්ධන දීමනාවක් ලබා දීම.
   - පුරාවිද්‍යා ස්ථාන රැක ගැනීම සඳහා යොදා ගෙන ඇති දීමනා රැකවල් කරුවන්ගේ දීමනාව වැඩි කිරීම.
10. ශාස්ත්‍රීයමය කටයුතු හඳුනා ගනිමින් ඒ සඳහා පුහුණුව පුළුල් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සහ ආයතනික කාර්ය භාරය සම්බන්ධ ගැටළු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම මඟින් දෙපාර්මේන්තුවේ සමස්ත කාර්යසාධනය ප්‍රශස්ථ මට්ටමට ළඟා කර ගැනීම සඳහා සපුරාගත යුතු ඉදිරි ක්‍රියාකාරකම් අතර ප්‍රධාන වේ.

2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමුඛතාවය මත හඳුනා ගත් සහ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහන් මුල්කර 2022 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මේ සාරාංශය භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් සමඟ පහත දක්වා ඇත.

2022 වර්ෂය සඳහා වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන

		ප්‍රතිපාදන රුපියල් මිලියන	
		මූලධන වියදම්	පුනරාවර්තන වියදම්
වැඩසටහන **01**	**207 - 01 - 01**	6.000	266.000
වැඩසටහන **02**	**207 - 02 - 02**	140.000	885.000
		146.000	**1,151.000**
සමස්ත මුල්‍ය ප්‍රතිපාදන			**1,297.000**

සාමාන්‍ය පරිපාලනය හා පුරාවිද්‍යා සේවය සඳහා වෙන්වූ මුල්‍ය ප්‍රතිපාදන - 2022

මූලධන ප්‍රතිපාදන (අංශ අනුව ව්‍යාපෘති) සාරාංශය

වැය ශීර්ෂය	වැඩ විස්තරය	රු.මි.	ව්‍යාපෘති ගණන
වැඩසටහන - **01 (සමාන්‍ය පරිපාලනය)**			
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		
207-01-01-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	0.500	01
207-01-01-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	0.500	
207-01-01-2003	වාහන	2.000	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම		
207-01-01-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	0.500	
207-01-01-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.500	
	හැකියා වර්ධනය		
207-01-01-2401	කාර්ය මණ්ඩල පුහුණු	1.000	
	උප එකතුව	**6.000**	**01**

වැය ශීර්ෂය	වැඩ විස්තරය	රු.මි.	ව්‍යාපෘති ගණන
වැඩසටහන - **02 (පුරාවිද්‍යා සේවය)**			
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		
207-02-02-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	3.000	06
207-02-02-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	0.500	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම		
207-02-02-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	0.500	
207-02-02-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.000	
	හැකියා වර්ධනය		
207-02-02-2401	කාර්ය මණ්ඩල පුහුණු	1.500	
	උප එකතුව	**6.500**	06
207-02-02-08-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ**	**14.000**	**49**
	i. ගවේෂණ හා ලේඛන ගත කිරීම්	8.500	36
	ii. කැණීම්	4.000	08
	iii. අභිලේඛන හා නාණක විද්‍යා	1.500	05
207-02-02-09-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය සහ නඩත්තු කිරීම**	**57.000**	**129**
	i. වාස්තුවිද්‍යා සංරක්ෂණ.	38.000	28
	ii. රසායන සංරක්ෂණ	4.000	47
	iii. නඩත්තු	15.000	54
207-02-02-10-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය සහ මහජන ප්‍රදර්ශනය**	**10.000**	**44**
	i. ප්‍රවර්ධන	6.800	13
	ii. මාධ්‍ය	0.700	01
	iii. කෞතුකාගාර	2.500	30
	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය	**49.000**	
207-02-02-05-2001	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය	1.000	**01**
207-02-02-05-2509	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය	48.000	
207-02-02-12-2509	**රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය**	**2.000**	01
207-02-02-15-2509	**කන්නියා උණුවතුර ළිං නඩත්තු කර පවත්වා ගෙන යාම**	**1.500**	01
	උප එකතුව	**133.500**	**225**
	මුළු එකතුව	**146.000**	**232**

වැය ශීර්ෂය	වැඩ විස්තරය	රු.මි.	ව්‍යාපෘති ගණන
පුනරාවර්තන වියදම් (නඩත්තු)			
වැඩසටහන - **01** (සමාන්‍ය පරිපාලනය)			
207-01-01-1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.000	3
වැඩසටහන - **02** (පුරාවිද්‍යා සේවය)			
207-02-02-1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	6.500	26
	උප එකතුව	**8.500**	**29**
	මුළු එකතුව	**154.500**	**261**

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා

සෝමරත්න පදිනාගිරණ
ලේකම්
බුද්ධශාසන ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල,
සෙත්සිරිපාය, බත්තරමුල්ල

.....
ගණන් දීමේ නිලධාරියා

මහාචාර්ය අනුර මනතුංග
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07

.....
ආයතන ප්‍රධානියා

A.L.A.C. Perera
Chief Accountant
Department of Archaeology
Sir Marcus Fernando Mawath
Colombo 07

03.පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ -එෆ්

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 (රු.)		සටහන	තත්‍ය (රු.) 2021	නැවත ගලපන ලද 2020	
	- ආදායම් ලැබීම්		-	-	
	- ආදායම් බදු	1	-	-	
	- දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
	- ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
	- බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
	- මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	- ආදායම් නොවන ලැබීම්		-	-	
	- භාණ්ඩාගාර අග්‍රිම		1,035,900,000	1,014,420,000	ඒසිඒ-3
	- තැන්පතු		19,113,652	94,058,993	ඒසිඒ-4
	- අත්තිකාරම් ගිණුම්		40,578,539	2,870,797	ඒසිඒ-5
	- වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		135,896,953	137,425,402	
	- මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,231,489,144**	**1,248,775,192**	
	- මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,231,489,144**	**1,248,775,192**	
	- භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**873**	-	
	- ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඇ)		**1,231,488,271**	**1,248,775,192**	
	- අඩුකළා : වියදම්				
	- පුනරාවර්තන වියදම්			-	
1,167,300,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	925,380,035	931,943,704	
79,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	70,663,256	66,708,894	ඒසිඒ-2(ii)
6,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	4,553,270	2,467,196	
	- පොළී ගෙවීම්	8	-	5,115,936	
	- වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,253,300,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**1,000,596,561**	**1,006,235,730**	

	මූලධන වියදම්				
9,900,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	6,870,097	5,330,748	
11,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	11,415,674	2,825,786	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,500,000	හැකියා වර්ධනය	14	1,429,065	66,920	
238,000,000	වෙනත් මූලධන වියදම්	15	100,704,830	80,664,737	
261,900,000	මුළු මූලධන වියදම් (උ)		**120,419,666**	**88,888,191**	
	- තැන්පතු ගෙවීම්		**42,326,923**	**100,211,421**	ඒසිඒ-4
	- අත්තිකාරම් ගෙවීම්		**52,832,582**	**23,423,263**	ඒසිඒ-5
	- වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	- ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**95,159,505**	**123,634,684**	
	- මුළු වියදම් ඒ = (ර්+උ+ඌ)		**1,216,175,732**	**1,218,758,605**	
1,515,200,000	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-ඒ)		**15,312,539**	**30,016,587**	
	- අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		15,312,539	30,016,587	ඒසිඒ-7
	- දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		15,312,539	30,016,587	ඒසිඒ-3
			-	-	

3.3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 (රු.)	තත්‍ය 2020 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,109,669,778	1,098,814,212
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5 (ඒ)	109,243,852	96,989,808
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	6,404,075
මුළු වත්කම්		**1,218,913,630**	**1,202,208,095**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		36,545,774	1,078,458
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,109,669,778	1,098,814,212
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5 (බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ - 4	72,698,078	95,911,350
අග්‍රිම ශේෂය	ඒසීඒ - 3	-	6,404,075
මුළු වගකීම්		**1,218,913,630**	**1,202,208,095**

පිටු අංක 01 සිට 39 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 40 සිට 58 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන දීමේ නිලධාරී
නම: සෝමරත්න විදානපතිරණ
තනතුර: ලේකම්
දින: බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
3 වන මහල,
සෙත්සිරිපාය, බත්තරමුල්ල

.....
ගණන් දීමේ නිලධාරී
නම: මහාචාර්ය අනුර මනතුංග
තනතුර: පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
දිනය: 2022/10/14
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
සිරිමා මාවත
කොළඹ 07

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගිණුම්කාධිකාරී/ අධ්‍යක්ෂ (මූල්‍ය)
නම: A.G. Perera
Chief Accountant
Department of Archaeology
Sri Marcus Fernando Mawatha
Colombo 07.
දිනය: 2022/10/14

3.4. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	2021 (රු.)	තත්‍ය නැවත ගලපන ලද 2020 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	135,896,953	137,425,402
අග්‍රිම ලැබීම්	1,035,900,000	1,014,420,000
අත්තිකාරම් අයකර ගැනීම්	40,578,539	2,870,797
තැන්පතු ලැබීම්	19,113,652	94,058,993
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,231,489,144**	**1,248,775,192**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	993,787,660	1,006,235,731
සහනාධාර සහ මාරුකිරීම්	4,553,270	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	19,365,012	23,612,512
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	873	6,404,075
අත්තිකාරම් ගෙවීම්	51,035,740	23,423,263
තැන්පතු ගෙවීම්	42,326,923	100,211,420
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,111,069,478**	**1,159,887,001**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)	**120,419,666**	**88,888,191**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-

උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	120,419,666	88,888,191
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**120,419,666**	**88,888,191**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(120,419,666)**	**(88,888,191)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5. මුල්‍ය ප්‍රකාශ සටහන්

* මුල්‍ය ප්‍රකාශ සටහන් ඉදිරිපත් කර ඇත.

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (රු.)		එකතු කරන ලද ආදායම (රු.)	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාළ නොවේ.				

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,253,300,000.00	1,253,300,000.00	1,000,596,558.00	80%
ප්‍රාග්ධන	261,900,000.00	261,900,000.00	120,419,665.60	46%
මුළු එකතුව	**1,515,200,000.00**	**1,515,200,000.00**	**1,121,016,223.60**	**74%**

3.8 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිසත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රතිපාදනය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ත්‍රිකුණාමලය	කන්නියා උණුවතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීම.	2,000,000.00	2,000,000.00	1,948,151.00	97%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	138,320,748.24	138,320,748.24	-	-
9152	යන්ත්‍රෝපකරණ	59,849,029.43	59,849,029.43	-	-
9153	ඉඩම	911,500,000.00	911,500,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විඛ්‍යාත්මක වත්කම				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව**

(85)



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } CAA/B/DA/79/2021/FA ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 18 දින

ගණන්දීමේ නිලධාරී,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ig@nadirgenerali.gov.lk www.nasl.gov.lk

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසෑදුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2021 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.108,817,280 ක් වූ අතර, ණය පාලන ගිණුමේ ශේෂය රු.109,243,852 ක් විය. ඒ අනුව එම රු.426,572 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	කේවල ශේෂ ලේඛනය සහ ණය පාලන ගිණුම අතර පවතින මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතු වේ.	මෙම රු.426,572 ක වෙනස අනාවරණය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
(ii)	මීයා යාම, විශ්‍රාම යාම, වැඩහහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සේවකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.4,413,293 ක් වූ ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වැඩි ණය ශේෂවල එකතුව රු.1,392,955 ක් විය. එම ගිහ ණය ශේෂ 2021 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ගිහ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	මේ පිළිබඳව පාලන ආංශය මගින් ලිඛිත පිළිතුරු ලබාදී නැත. මේ වන තෙක් එම ණය ශේෂ අයකරගෙන නැත.

(ආ) දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i) 1998 වර්ෂයේදී අත්තනගල්ල ඔයෙන් හමු වූ වසර 1270 ක් පමණ පැරණි අඩි 59 අහල් 11 පමණ දිගින් යුතු ඉපැරණි පාරුවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් රැගෙනවිත්, කොළඹ ජාතික කෞතුකාගාර භූමියේ ජල ටැංකියක තැන්පත් කර තිබුණි. මෙම පාරුව සංරක්ෂණය කිරීමේ කාර්යය භාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය වන පොලිඑතිලීන් සහ ග්ලයිකෝල් නැමති රසායන ද්‍රව්‍යයද රුපියල් මිලියන 04 ක් පමණ වැය කර මිලදීගෙන තිබුණි. නමුත්, 2001 වර්ෂය දක්වාම එම රසායන ද්‍රව්‍ය භාවිතා කර එම පාරුව සංරක්ෂණය කිරීම සිදු කර නොතිබූ අතර, එම රසායන ද්‍රව්‍ය වෙනත් කාර්යයන් දෙකකට භාවිතා කර තිබුණි. ඒ අනුව පසුව වෙනත් ක්‍රමවේදයකට මෙම පාරුව සංරක්ෂණය කිරීමේ කාර්යය ඉටු කිරීමට රසායන සංරක්ෂණ අංශය පියවරගෙන තිබුණි. නමුත් සංරක්ෂණ ක්‍රමවේදය හා කාර්යය නියමිත කාල රාමුව තුළ යෝග්‍ය පරිදි සිදු නොකිරීම නිසා 2021 වර්ෂය අවසාන වන විට පාරුවේ දැව කොටස් දැඩි ලෙස දිරාපත් වී පාරුව සම්පූර්ණයෙන්ම විනාශයට භාජනය වී තිබුණි.	දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාරය පුරාවිද්‍යාත්මක ස්ථාන, පුරාවස්තු පිළිබඳ ගවේෂණය, කැණීම් කිරීම හා සංරක්ෂණය වේ. එම ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන සංරක්ෂණ කාර්යය නිසි පරිදි ඉටු නොකිරීම නිසා මෙම පුරාවස්තු හානි වී විනාශ වී තිබුණි. ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට ක්‍රියා කළ යුතුව පවතින අතර, සියළු පුරාවස්තු ආරක්ෂා කිරීමට හා සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණි.	සංරක්ෂණ ක්‍රමවේදය අවසන් වූ පසු නිසි තත්ත්වය යටතේ ප්‍රදර්ශනයට පියවර නොගැනීම සහ ස්වභාවික හානි සිදුවීම නිසා 2019 වසර අවසාන වන විට පාරුවේ බොහෝ කොටස් දැඩි ලෙස දිරාපත් වී ඇත.

(ii)	රසායනාගාරය තුළ පවතින රසායන ද්‍රව්‍ය ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා අවශ්‍ය රාක්ක නොමැති වීමත්, අපහරණය කළ යුතු රසායන ද්‍රව්‍ය විවිධ හේතු මත අපහරණය කර නොතිබීමත් නිසා එම රසායන ද්‍රව්‍ය අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. තවද, එම රසායනාගාරය තුළම 1950 වර්ෂයේ පමණ සිට කැණීම් සහ සංරක්ෂණ අංශ මගින් සොයාගත් පුරාවස්තු විශාල ප්‍රමාණයක් පැවති අතර, ඇතැම් පුරාවස්තු සංරක්ෂණය කිරීමටද කටයුතු කර නොතිබුණි. අතීතයේ සිට විධිමත්ව සකස් කළ පුරාවස්තු පිළිබඳ ලේඛනයක් නොතිබූ අතර, 2020, 2021 වර්ෂවල පුරාවස්තු ලේඛනගත කිරීම් ආරම්භ කළද, වර්තමානය වන විට පුරාවස්තු විශාල ප්‍රමාණයක් ලේඛනගත කිරීමකින් තොරව අනාරක්ෂිතව පැවතුණි.	අපහරණය කළ යුතු රසායන ද්‍රව්‍ය අපහරණය කිරීමට ක්‍රියා කළ යුතු අතර, ප්‍රයෝජනයට ගත හැකි රසායන ද්‍රව්‍ය ආරක්ෂිතව ගබඩා කර තැබීමටත් ක්‍රියා කළ යුතු වේ. අංශය භාරයේ ඇති පුරාවස්තු සංරක්ෂණය කර ආරක්ෂා කිරීමටත්, එම පුරාවස්තු සියල්ල විධිමත්ව ලේඛනගත කිරීමටත් පියවර ගත යුතුය.	2022 දී ලැයිස්තුගත කිරීම් හා ලේඛනගත කිරීම් ආරම්භ කරන ලදී. ලේඛනගත කිරීම් අවසන් කළ පුරාවස්තු අදාළ සුදුසු ස්ථාන වෙත භාරදීමට සැලසුම් කර ඇත.

(ඇ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය		නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
		වටිනාකම	අනුකූල නොවීම		
		රු.			
(i)	2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 V වගන්තිය	-	විශ්‍රාමිකයින් නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුළදී සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනාගෙන පුරුදු පුහුණු කළ යුතු වුවත්, එසේ පුරුදු කිරීමකින් තොරව කොන්ත්‍රාත්	මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.	මේ වන විට සිටින නිලධාරීන් මගින් එම කටයුතු ඉටු කරවා ගැනීමට කටයුතු කරමි.

		පදනම මත බඳවාගත් සේවකයින් නැවත නැවතත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.		
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටස, 13.2 වගන්තිය	- කෝට්වේ පුරාවිද්‍යා කෞතුකාගාර පරිශ්‍රයේ මෝටර් රථ 02 ක්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ මෝටර් රථ 02 ක්, යතුරු පැදි 06 ක් සහ ප්‍රාදේශීය කාර්යාලවල ලොරි රථ 02 ක් අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත් වෙමින් ගාල් කර තිබුණි.	මෙම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.	මෙම වාහන අපහරණය කිරීමට හා වෙන්දේසි කිරීමට කටයුතු කරමින් පවතී.

(ඇ) අවධිමත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත රාජ්‍ය සේවයේ යෙදීමට බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නිලධාරීන් 09 දෙනෙකු එසේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්‍රාම යාමෙන් පසුව කොන්ත්‍රාත් පදනම මත නැවත බඳවාගෙන තිබූ අතර, එම නිලධාරීන් අතුරින්ද නිලධාරීන් 02 කු සඳහා පමණක් 2021 ඔක්තෝම්බර් 15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සේවයේ යෙදවීමට අනුමැතිය ලබාදී තිබුණි.	විශ්‍රාමික නිලධාරීන් සේවයේ යෙදවීමට ප්‍රථම රාජ්‍ය සේවා කොමිසමේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර, පවත්නා වලංගු නීති රීති හා චක්‍රලේඛ වලට අනුකූලව පමණක් ක්‍රියා කළ යුතුව තිබුණි.	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබෙන තෙක් අමාත්‍යාංශ ලේකම්තුමාගේ ආවරණ අනුමැතිය ලබාදුන් බැවින් සේවයේ යොදවා ගන්නා ලදී.

2. මූල්‍ය සමාලෝචන

2.1. බැරකම් හා බැඳීම් වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් 01 හි 1301 දරන වැය විෂයයට අදාළව ප්‍රතිපාදන ඉතිරිය රු.2,263,948 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව මුළු බැරකම් රු.8,029,634 ක් වීම නිසා එම වැය විෂයය සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු.5,765,686 ක බැරකම් වලට එළඹී තිබුණි.	ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට එළඹීමට ක්‍රියා නොකළ යුතුව තිබුණි.	අදාළ නිරීක්ෂණය සම්බන්ධ එකඟ වෙමි.
(ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට අධිකරණයේ නඩු 67 ක් විභාග කරමින් පැවති අතර, එම නඩු අතරින් බණ්ඩාරවෙල සහ මාතර දිසා අධිකරණයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ සේවකයින්ට විරුද්ධව නඩු 02 ක් පවරා තිබුණි. එසේ රාජ්‍ය නිලධාරීන් වගඋත්තරකරුවන් කරමින් පවරන ලද එම නඩු දෙක මත පැවති අසම්භාව්‍ය බැරකම් එකතුව රු.141,500,000 ක් විය.	මෙම අධිකරණ වල විභාග වන නඩු වලදී දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය සොයා බලා මැනවින් ඉටු කළ යුතු අතර, දෙපාර්තමේන්තුවට එරෙහිව පනවා ඇති නඩු පිළිබඳවත්, ඒ සඳහා වන බැරකම් පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණි.	නිරීක්ෂණය සඳහා පිළිතුරු ලබාදී නැත.

2.2. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2012 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ඇමරිකානු අරමුදල් දායකත්වය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 323.8 ක් වූ රජගලනැන්න පුරාවිද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතියට සමාලෝචිත වර්ෂයට සංශෝධිත ඇස්තමේන්තු අනුව ශුද්ධ ප්‍රතිපාදනය රු.31,069,722 ක් වූ නමුත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතියේ විවිධ කටයුතු අත්හිටුවීම හේතුවෙන් වර්ෂය තුළ කැණීම් වැඩබිම් 02 ක් සහ සංරක්ෂණ වැඩබිම් 05 ක කටයුතු අවසන් කර නිබුණි. ඒ අනුව සංශෝධිත ප්‍රතිපාදනයෙන් රු.17,903,317 ක මුදලක් වැයකර සියයට 58 ක මූල්‍ය ප්‍රගතියක් හා සියයට 77 ක භෞතික ප්‍රගතියක් ලභා කරගෙන නිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී නිම කළ යුතුව නිබුණද වර්තමානය වන විට ඇති වී තිබෙන මූල්‍ය හා විවිධ බාධාවන් නිසා එම කාර්යයන් එදිනට නිම කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වී නිබුණි.	2022 වර්ෂය තුළ අවසන් කළ යුතුව පවතින මෙම රජගලනැන්න වැඩ බිම තුළ 2021 වර්ෂය තුළද සැලසුම් කළ පරිදි කාර්යය ඉටු කර නොනිබුණි. ඒ අනුව රට තුළ පවත්නා වාතාවරණය පිළිබඳවද අවධානය යොමු කර විදේශ මුදල් ලැබීම් ඵලදායී කාර්යයක යෙදවීමට හා කාර්යය නිම කිරීමට අවධානය යොමු කළ යුතුව නිබුණි.	අදාළ නිරීක්ෂණය සමහ එකහ වෙමි.

2.3. නැන්පත් ශේෂයන්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) ඡායාරූප වාර්තාකරණ අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර නිබූ එකතුව රු.2,415,342 ක මුදලක් අදාළ කාර්යයන් සඳහා භාවිතා නොකර 2021 දෙසැම්බර් 31 දිනටද පොදු නැන්පතු ගිණුම තුළ නිශ්කාර්යාව නිබුණි.	මෙම පොදු නැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති මුදල් අදාළ කාර්යය සඳහා භාවිතා කර කාර්යය නිම කළ යුතුව නිබුණි.	නිරීක්ෂණය සමහ එකහ වෙමි.

(ආ) මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව වසර 02 ඉක්ම වූ තැන්පතු කල් ඉකුත් වූ තැන්පතු ලෙස සලකා මුදල් රෙගුලාසි 571 අනුව ක්‍රියා කළ යුතු වුවත්, තැන්පතු ගිණුම් 02 කට අදාළව එකතුව රු.48,068,751 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර තැන්පතු ගිණුම් තුළ රඳවා තබාගෙන නිබුණි.	මෙම තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුව තිබුණි.	අදාළ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.

2.4. බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.947,555 ක් වූ දෙපාර්තමේන්තුව වෙත සෘජුව බැර වන ආදායම් හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව මාස 06 ඉක්ම වූ මෙම ලැබීම් සහ හඳුනා නොගත් ලැබීම් ලෙස සටහන් කර බැංකු සැසඳුම් සකස් කර නිබුණි.	බැංකු ජංගම ගිණුමට සෘජුව බැරවන ආදායම් හඳුනාගෙන නිරවුල් කර බැංකු සැසඳුම් සකස් කළ යුතු වේ.	අදාළ නිරීක්ෂණය නිවැරදිය.
(ආ) 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ නමුත් බැර නොවූ රිසිවි පත්‍ර 02 ක එකතු වටිනාකම රු.303,825 ක් විය. මාස 06 කට වැඩි කාලයක සිට උපලබ්ධි නොවූ මෙම වටිනාකම් හඳුනාගෙන නිවැරදි කිරීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් පිළියෙල කර නිබුණි.	තැන්පත් කළ නමුත් බැර නොවූ තැන්පතු හඳුනාගෙන නිවැරදි කර, බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.	අදාළ නිරීක්ෂණය නිවැරදිය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යය භාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) කැළණි විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම සඳහා රාජ්‍ය සංස්ථාවකින් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.1,494,434 ක මුදලක් 2020 දෙසැම්බර් 11 දින රජයේ ආදායමට බැර කර තිබුණි. 2021 වර්ෂයේ රේවිය අමාත්‍යාංශ ලේකම්වරියගේ මූලිකත්වයෙන් පැවති රැස්වීමකදී ලබාදුන් උපදෙස් අනුව එම මුදල් නැවත ලබාගෙන එම අරමුණු හා කාර්යයන් ඉටු කිරීමට උපදෙස් ලබාදී තිබුණද, එම උපදෙස් ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි.	ලබාදුන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුව තිබුණි.	රැස්වීමේදී ලබාදුන් උපදෙස් මත ක්‍රියා කර ඇත. එම මුදල් පරිහරණය සඳහා සැලසුම් සකස් කර ඇත.
(ආ) කැළණි විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය මඟින් සිදු කර තිබුණි. විහාරස්ථානයේ පවතින සිතුවම් සහ මූර්ති වර්තමානය වන විට විශාල වශයෙන් පතුරු ගැලවී ගොස් සහ හායනයට ලක්වී විනාශ වීමට භාජනය වෙමින් පැවතුණි. මෙම සිතුවම් හා මූර්ති සංරක්ෂණ කටයුතු සඳහා සේවකයි 04 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබූ අතර, විවිධ හේතූන් මත ඔවුන් මන්දගාමීව එම කාර්යයන් ඉටු කිරීම නිසා සිතුවම් හා මූර්ති සංරක්ෂණය සිදුකරන වේගයට වඩා වැඩි වේගයකින් ඒවා විනාශයට භාජනය වෙමින් පැවතුණි.	දෙපාර්තමේන්තුවේ අරමුණු අතර සංරක්ෂණය වැදගත් කාර්යයක් වේ. කැළණිය වැනි මහජන ගෞරවයට නිරන්තරව භාජනය වන ස්ථානයක් සංරක්ෂණය කර ආරක්ෂා කිරීමට ක්‍රියා කළ යුතුව තිබුණි.	හැකි උපරිම අයුරින් මෙම සංරක්ෂණ කටයුතු සඳහා කාර්යය මණ්ඩලය යොදවා ඇත. රක්ෂණ සංස්ථාව මඟින් ලබාදුන් ප්‍රතිපාදන යළි ලබාදෙන්නේ නම් සංරක්ෂණය කඩිනමින් සිදු කළ හැකිය.

(ඇ) දෙපාර්තමේන්තුවේ පුරාවස්තු ආරක්ෂක ඒකකය ඉදිරිපත් කළ තොරතුරු අනුව 2021 වර්ෂය තුළ පුරාවස්තු පනත උල්ලංඝනය කිරීමේ අවස්ථා 232 කට අදාළව අධිකරණයේ නඩු පවරා තිබුණි. එම නඩු අතර පුරාවස්තු සොරකම් කිරීමේ අවස්ථා 03 ක්, පුරාවස්තු විනාශ කිරීම් සම්බන්ධ නඩු 14 ක්, අනවසර කැණීම් සම්බන්ද නඩු 199 ක්, අනවසර අත්පත් කරගැනීම් සම්බන්ධ නඩු 02 ක් සහ වෙනත් නඩු 14 ක් පවරා තිබුණි. වර්ෂය තුළදී නඩු 122 ක් අවසන් කර තිබූ අතර, එමඟින් එකතුව රු.38,865,000 ක දඩ මුදල් අයකරගෙන තිබුණි. නමුත් 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළ පුරාවස්තු සොරකම් කිරීම් සහ විනාශ කිරීම් සිද්ධීන් පිළිවෙලින් 273, 121 සහ 383 ක් වාර්තා වී තිබූ අතර, ඒ අනුව මෙම සිද්ධීන් කාලීනව වර්ධනය වී තිබුණි.	පුරාවස්තු සොරකම් කිරීම්, හානි කිරීම් සහ විනාශ කිරීම් වැළැක්වීම සඳහා ගත යුතු සුදුසුම් ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු අතර, ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණි.	අදාළ නිරීක්ෂණය නිවැරදිය.
(ඈ) කැණීම් අංශය මඟින් පුරාවිද්‍යා ස්ථාන කැණීම් සහ කැණීම් වාර්තා සැකසීම් සම්බන්ධ ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.5,191,499 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණි. වර්ෂ අවසානය වන විට ව්‍යාපෘති 04 ක කාර්යයන් නිම කර තිබූ අතර, එහි සමස්ථ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 37 ක් සහ 75 ක් විය. ඒ අනුව ව්‍යාපෘති 06 ක කාර්යය නිම කිරීමට නොහැකි වී තිබූ අතර, වර්තමානයේ පවත්නා මූල්‍ය අර්බුදය නිසා කාල නිර්ණය කටයුතු සඳහා යොමු කළ යුතු ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීම මේ සඳහා හේතු වී තිබුණි.	රටේ පවත්නා තත්ත්වය කාර්යසාධනය සඳහා බාධාවක් වුවත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ රට විවෘතව තැබීම හා කාර්යයන් ඉටු කිරීමේ හැකියාව පැවතීම නිසා ප්‍රගතිය ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කළ යුතුව තිබුණි.	වර්ෂය තුළ කැණීම් සහ කැණීම් වාර්තා සැකසීම් ව්‍යාපෘති 12 ක් රු.5,191,499 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ අතර, වර්ෂය අවසානය වන විට ව්‍යාපෘති 06 ක කාර්යයන් නිම කර තිබුණි.

(ඉ)	දෙපාර්තමේන්තුවේ බස්නාහිර ප්‍රාදේශීය කාර්යාලය මගින් බස්නාහිර පළාත තුළ ඇති ස්ථාන 65 ක් ගැසට් කිරීමට යෝජිතව තිබුණි. නමුත් ස්මාරක ගැසට් කිරීමේ ලේඛනය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ එම කාර්යයන් අවසන් කර නොතිබුණි.	ස්මාරක ගැසට් කිරීමේ කාර්යය සඳහා අවධානය යොමු කළ යුතුය.	මෙම ස්ථාන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කර ඇත. ඒ අනුව අදාළ ලේඛන නිති කොටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.
(ඊ)	දෙපාර්තමේන්තුවේ බස්නාහිර පළාත් කාර්යාලය යටතේ ඇති පාහියංගල ගල්ලෙන ආශ්‍රිත සංරක්ෂණ සහ කැණීම් කටයුතු 2012 වර්ෂයෙන් පසුව වසර 09 ක පමණ කාලයක් නතර කර දමා තිබුණි. විගණනය විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව අක්කර 40 ක පමණ භූමි ප්‍රදේශයක් අයත් මෙම ගල්ලෙන අවට මැණිම් කටයුතු සිදු කර මායිම් කණු සිටුවා නොතිබූ අතර, මෙම ගල්ලෙන සම්බන්ධව ගවේෂණය කර ගවේෂණ වාර්තාවක්ද නිකුත් කර නොතිබුණි.	මෙම ගල්ලෙන අවට මැණිම් කටයුතු අවසන් කර මායිම් කණු සිටුවීමටත්, අදාළ ගවේෂණ වාර්තා නිකුත් කිරීමටත් කටයුතු කළ යුතුව තිබුණි.	පිළිතුරු ලබාදී නැත.

3.2. අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මගින් එකතුව රු.54,145,000 ක් වැය කර ව්‍යාපෘති 32 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.24,154,948 ක් වැය කර ව්‍යාපෘති 13 ක වැඩ අවසන් කර තිබුණි. ඒ අනුව විවිධ හේතු මත නිම කළ නොහැකි වූ ව්‍යාපෘති ගණන 19 ක් වූ අතර, ඉටු කළ කාර්යයන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 45 ක් සහ 71 ක් විය.	ව්‍යාපෘති 32 කින් 13 ක පමණක් කටයුතු ඉටු කිරීම නිසා සියයට 50 කවත් ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි. සැලසුම් කළ පරිදි කාර්යය භාරය ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණි.	ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අවසන් කාර්තුවට යෝජිත ව්‍යාපෘති 18 ක කටයුතු ඉටු කිරීමට නොහැකි විය.

(ආ) ගවේෂණ සහ ලේඛනගත කිරීම් අංශය යටතේ පුරාවිද්‍යා ස්ථාන 13 ක් පුරාවිද්‍යා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය සඳහා යවා තිබුණි. නමුත් ඒ අතරින්, මාමඩුව මූල ඓතිහාසික සුසාන භූමිය සඳහා පමණක් අනුමැතිය ලැබී තිබුණි. තවද, ප්‍රකාශයට පත් කර ඇති රක්ෂිතයන් 176 ක මිනින්දෝරු සැලසුම් ලබා ගැනීම සඳහා සර්වේ ජනරාල් වෙතින් ඉල්ලීම් කර තිබුණද ස්ථාන 56 ක් සඳහා පමණක් මිනින්දෝරු සැලසුම් ලැබී තිබුණි.	වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කළ කාර්යය භාරය ඉහළ කාර්යසාධන මට්ටමකින් ඉටුකර ගැනීමට අවධානය යොමු කළ යුතුව තිබුණි.	අදාළ නිරීක්ෂණය නිවැරදිය.

3.3. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) දෙපාර්තමේන්තුවේ රසායනාගාරයට සපයා ඇති විදුලි සැපයුම් දෝෂ සහ අධි පීඩන ජල සැපයුමක් ලබා නොදීම හේතුවෙන් එම අංශය භාරයේ පවතින රික්තක උඳුන, ආර්ද්‍රතා කුටිය, ජල පිරිපහදු පද්ධතිය සහ අක්ෂි සේදීමේ පද්ධතිය අදාළ සංරක්ෂණ කාර්යයන් සඳහා භාවිතා කිරීමට නොහැකිව නිශ්කාර්යක්ෂම වත්කම් ලෙස රසායනාගාරය තුළ පැවතුණි.	විදුලි සැපයුම් දෝෂ සහ ජල සැපයුම් දෝෂ නඩත්තු අංශය මඟින් වීසඳා දීමට කටයුතු කළ යුතු අතර, එමඟින් නිශ්කාර්යක්ෂම වත්කම් ඵලදායී කාර්යයක යෙදවීමට කටයුතු කළ යුතුය.	රසායනාගාරයේ කටයුතු නව ඉදිකිරීමක් ලෙස කළ යුතු වුවද, නව ඉදිකිරීම් නවතා ඇති බැවින් ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කර ඇත.

(ආ)	පුරාවිද්‍යාත්මක විවිධ කැණීම් වලදී හමු වූ වංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් දීර්ඝ කාලයක සිට අභිලේඛන හා නාණක විද්‍යා අංශය, රසායනාගාර අංශය සහ කලාප කාර්යාල වල විධිමත්ව ලේඛනගත කිරීමකින් තොරව පැවතුණි. 2020 විගණකාධිපති වාර්තාව ප්‍රකාරව මෙම කාසි ලේඛනගත කිරීම් ආරම්භ කර නිබුණද, 2022 අප්‍රේල් මස වන විටත් එම කාර්යයන් නිම කර නොනිබුණි.	වංචල පුරාවස්තු ලේඛනගත කිරීමටත්, ඒවා ආරක්ෂා කිරීමටත් ක්‍රියා කළ යුතුය.	කඩිනමින් අදාළ නිරීක්ෂණය නිවැරදිය.

3.4. පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
අත්තනගල්ල ඔයෙන් හමුවී කොළඹ ජාතික කෞතුකාගාර භූමියේ තැන්පත් කර නිබූ අත්තනගල්ල පාරුවේ නිමිකාරිත්වය සහ සංරක්ෂණමය කාර්යය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පැවරී නිබුණි. නියමිත කාලවකවානුව තුළ යෝග්‍යතාව සංරක්ෂණ ක්‍රමවේදයන්ට අනුව මෙම පාරුව සංරක්ෂණය නොකිරීම නිසා එය ඉතා කුඩා දැව කොටස් දක්වා විනාශ වී නිබුණි. විනාශයට භාජනය වූ එහි දැවමය කොටස් නැවීමට ආධාරකයක් සකස් කිරීම සඳහා 2021 වර්ෂය තුළ එකතුව රු.1,770,876 ක් වැය කර නිබූ අතර, වර්තමානය වන විට එම දිරාපත් වූ දැව කොටස් සංරක්ෂණ සීමා ඉක්මවා නිබීම නිසා එහි සත්‍ය ප්‍රමාණයේ අනුරුවක් සකස් කිරීම සඳහා යළි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ගෙනවිත් නිබුණි. ඒ අනුව හඳුනාගත නොහැකි තත්ත්වයෙන් දැඩි ලෙස විනාශ වූ මෙම පාරුවෙහි දැවමය	රට තුළ පවතින මූල්‍ය අර්බුධය වැනි වාතාවරණය පිළිබඳවද අවධානය යොමු කර ඵලදායී නොවන ව්‍යදම් අවම කිරීමටත් හානි හා පාඩු අවම වන ලෙස ක්‍රියා කිරීමටත් කළමනාකරණය කටයුතු කළ යුතුව නිබුණි.	උක්ත පාරුවේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම මත එය සංරක්ෂණ සීමා ඉක්මවා ගියද අපහරණය කළ නොහැක. එය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව නැවත ප්‍රදර්ශනය කිරීමට නියමිතය.

කොටස් නැබීමට සකස් කළ මෙම යකඩ ආධාරකය නිශ්කාර්යා වියදමක් බව නිරීක්ෂණය විය.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය මඟින් එම ජලාශයට යටවන භූමිය තුළ තිබූ පුරාවස්තු, කැණීම් කර ඉවත් කර තිබූ අතර, අදාල කැණීම් කාර්යයන් ඉටු කිරීමට රු.10,000,000 ක මුදලක් 2019 ජනවාරි 19 දින වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි.ඒ පිළිබඳව සකස් කළ හානි ඇගයුම් වාර්තාවට අනුව එම පුරාවස්තු ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා කෞතුකාගාරයක් ඉදිකිරීමට යෝජනා කර ඒ සඳහා වන මූලික සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත සිදු කළ දැන්වීමට අනුව කෞතුකාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් සකස් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. නමුත් 2022 වර්ෂය වන විටත් එම කෞතුකාගාරය සඳහා ගොඩනැගිලි ඉදිකර නොතිබූ අතර, මෙම කෞතුකාගාරය ඉදිකිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමු නොකිරීම හේතුවෙන් එම	මෙම පුරාවස්තු ආරක්ෂා කිරීමට පියවර ගත යුතු අතර, ඒ සඳහා අවශ්‍ය කෞතුකාගාරය ඉදිකිරීමට අදාළ ව්‍යාපෘතියේ සහය ලබාගත යුතුව තිබුණි.	යාන් ඔය කෞතුකාගාරයේ වාස්තු විද්‍යා සැලසුම් සංශෝධනය කර වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත යොමු කර ඇත. මෙම කෞතුකාගාරය ඉදිකිරීමෙන් අනතුරුව පුරාවස්තු ප්‍රදර්ශනය කිරීමට නියමිතය.

පුරාවස්තු ආනාරක්ෂිතව තවදුරටත් අනුරාධපුර විශ්ලේෂණ ශාඛාවේ සහ පදවිය පුරාවිද්‍යා කලාප කාර්යාලය තුළ ගබඩා කර තිබුණි.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා නිති අංශයක් ස්ථාපිත කර තිබුණි. එහි සේවය කරන සහකාර නීති නිලධාරීන් 2021 වර්ෂය තුළ දිවයින පුරා ඇති විවිධ අධිකරණවල විභාග කරන නඩු සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටීමට සහභාගී වී තිබුණි. නමුත්, අධිකරණවල විභාග වන විවිධ නඩු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කිරීමට මෙම නීති නිලධාරීන් සහභාගී වී තිබුණද, 2021 වර්ෂයේ ජූනි, ජූලි සහ අගෝස්තු මාස වලදී එසේ අධිකරණ නඩු සඳහා සහභාගී වීමට පෙර පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.	නීති අංශයේ කටයුතු විධිමත් කළ යුතුව පවතින බව නිරීක්ෂණය වූ අතර, දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අධිකරණ වලට යාම වඩාත් විධිමත්ව හා පූර්ව ලිඛිත අවසර මත පමණක් සිදු කළ යුතුව තිබුණි.	නීති අංශයේ මාසික ඉදිරි වැඩසටහන් ජූනි, ජූලි, අගෝස්තු මාස වලදී අනුමත කර ගැනීමට නොහැකි විය.
(ඇ) දෙපාර්තමේන්තුවේ රසායනාගාර ගොඩනැගිල්ලේ වහලය, බිත්ති, සිවිලිම සහ කපරාරුවන්, විදුලි සැපයුම් පද්ධතියන් කැඩී බිඳී ගොස් දැඩි ලෙස හානි සිදුවී තිබුණි. එහි අභ්‍යන්තරයේ පවතින උපකරණ හා දේපළ වලටද හානි සිදුවිය හැකි තත්ත්වයක ගොඩනැගිල්ල පැවතියද, එම ගොඩනැගිල්ල කාර්යාලයක් පවත්වාගත හැකි තත්ත්වයට අළුත්වැඩියා කිරීමට හෝ එම ස්ථානයෙන් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ලබාදී ඇති පිළිතුර ප්‍රකාරව මෙම ගොඩනැගිල්ල සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන යුතුව තිබුණි.	නිරීක්ෂණය නිවැරදිය.

4. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 4373 ක්ද, තත්‍ය කාර්යය මණ්ඩලය 1858 ක්ද වීම නිසා පුරප්පාඩු සංඛ්‍යාව 2515 ක් විය. මෙම පුරප්පාඩු අතර, විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක් පැවති අතර, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 34 ක් පැවතුණි. මෙම පුරප්පාඩු සඳහා වැඩබලන සහ වැඩ ආවරණ වැනි පදනම් යටතේ සේවකයින් සේවයේ අනුයුක්ත කර තිබූ අතර, එම තනතුරු සඳහා ස්ථිරව බඳවා ගැනීමට විවිධ බාධාවන් ඇති වී තිබුණි. ඒ අනුව අනුමත මුළු කාර්යය මණ්ඩලයෙන් සියයට 58 ක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාර්යභාරය ඉටු කිරීමෙදී විවිධ බාධාවන් ඇති වී තිබුණි.	බඳවා ගැනීම් පටිපාටිය සහ පවත්නා නීති රීති අනුව මෙම සේවක පුරප්පාඩු අවශ්‍යතාව මත පදනම්ව කඩිනමින් සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය.	විවිධ මට්ටම් වල පවතින මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවති.

එච්.එම්.රණසිංහ මෙණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04. පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශකය

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශකය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
1	සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන			√
2	ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන		√	
3	නඩත්තු කර පවත්වා ගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන			√

05.පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරන උත්සහයන් ශක්තිමත් කිරීම.

ප්‍රධාන කාර්ය සාධක දර්ශක 03

1. සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන.
2. ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන.
3. නඩත්තු කර පවත්වාගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන.

ඉලක්කය	උපාය මාර්ගය / අරමුණු		ප්‍රධාන කාර්යසාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරන උත්සහයන් ශක්තිමත් කිරීම.	**1.1**	**විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම.**				
	1.1.1	2030 වන විට පුරාවිද්‍යා ස්ථානයක් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.	ස්ථාන ගණන	මෙහි කටයුතු සිදු කරමින් පවති		
	1.2	**පුරාවිද්‍යා ස්ථාන නියමු සැලසුම් තුළ හඳුනා ගෙන ඇති වැඩසටහන් තුළින් ප්‍රශස්ත මට්ටමට ගැනීම.**				
	1.2.1	නියමු සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම - (වර්ෂයකට 05)	පුරාවිද්‍යා ස්ථාන ගණන		√	
	1.3	**ගවේෂණය කිරීම / ගැසට් කරනු ලබන පැරණි පුරාවිද්‍යා ස්මාරක සහ ස්ථාන වැඩි කිරීම.**				
	1.3.1	ආරක්ෂිත ස්මාරක සහ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම - (ආරක්ෂිත ස්මාරක වර්ෂයකට 100 / වෙන් කළ ප්‍රදේශ 25)	ආරක්ෂිත ස්මාරක සහ ස්ථාන ගණන		√	
	1.3.2	උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස්කිරීම.	රැස්කරන දත්ත ප්‍රතිශතය		√	
	1.3.3	පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම.	පොත් සංඛ්‍යාව		√	
	1.3.4	දෛනික ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම.	කරන ලද ගවේෂණ සංඛ්‍යාව		√	
	1.3.5	චංචල පුරාවස්තු ලේඛණ ගත කිරීම.	ලේඛණ ගත කරන ලද පුරාවස්තු සංඛ්‍යාව			√

ඉලක්කය	උපාය මාර්ගය / අරමුණු		ප්‍රධාන කාර්යසාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	75% - 89%	50% - 74%
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරන උත්සහයන් ශක්තිමත් කිරීම.	**1.4**	**ප්‍රජාව, පාසැල් සහ විශ්වවිද්‍යාල ළමුන්ගේ සහභාගිත්වයෙන් ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.**				
	1.4.1	ස්ථානීය දැනුවත් කිරීමේ වැඩමුළු - (ස්ථාන ගණන වසරකට 15)	වැඩ මුළු ගණන	√		
	1.4.2	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන ආයතන සඳහා පුරාකුටි පිහිටුවීම.	පුරාකුටි සංඛ්‍යාව			
	1.4.3	පාසැල් හා විශ්වවිද්‍යාලවලට පුරාවිද්‍යා ස්ථාන රැකබලා ගැනීමට බාරදීම - (වසරකට 60)	ස්ථාන සංඛ්‍යාව			
	1.4.4	ශ්‍රමදාන පැවැත්වීම - (වසරකට 30)	පැවැත් වූ ශ්‍රමදාන සංඛ්‍යාව	√		
	1.5	**දෙස් විදෙස් ජනතාව දැණුවත් කිරීම සඳහා වැඩසටහන්.**				
	1.5.1	ජංගම ප්‍රදර්ශන පැවැත්වීම - (වසරකට 30)	පැවැත්වූ ප්‍රදර්ශන සංඛ්‍යාව			
	1.5.2	ග්‍රන්ථ මුද්‍රණය - (වසරකට 10)	මුද්‍රණය කළ ග්‍රන්ථ සංඛ්‍යාව	√		
	1.5.3	දේශන පැවැත් වීම - (වසරකට 100)	පැවැත් වූ දේශන සංඛ්‍යාව		√	
	1.5.4	වීඩියෝ වැඩසටහන් සකස් කිරීම - (වසරකට 25)	සකස් කළ වීඩියෝ වැඩ සටහන් සංඛ්‍යාව			
	1.5.5	සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය.	වැඩ සටහන් සංඛ්‍යාව			
	1.5.6	පුස්තකාලවලට ග්‍රන්ථ මිලදී ගැනීම - (වසරකට 200)	මිලදී ගත් ග්‍රන්ථ සංඛ්‍යාව			√
	1.5.7	කෞතුකාගාර 28 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	කෞතුකාගාර සංඛ්‍යාව	√		
	1.5.8	සංචාරක මහ පෙන්වන්නන්ගේ දැනුම වැඩිකිරීම.	සංචාරක මණ්ඩලයේ ඉල්ලීම් අනුව සම්පත් දායකත්වය සැපයීම.			

ඉලක්කය	උපාය මාර්ගය / අරමුණු		ප්‍රධාන කාර්යසාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරන උත්සහයන් ශක්තිමත් කිරීම.	**1.6**	**පුරාවස්තු ස්ථාන හා ස්මාරක නඩත්තු කිරීම.** (වසරකට 200 පමණ)				
	1.6.1	පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම - කලාප 96 (වැඩබිම් 200 පමණ).	ආරක්ෂා කර නඩත්තු කරන ලද සහ ප්‍රතිසංස්කරණය කළ ස්මාරක ප්‍රමාණය			√
	1.6.2	පුරාවිද්‍යා ස්මාරක නඩත්තු කිරීම - (වසරට 50)	ප්‍රතිසංස්කරණය කළ ස්මාරක ප්‍රමාණය			√
	1.6.3	මායිම් කණු යෙදීම.	මායිම් කණු යෙදූ ස්ථාන සංඛ්‍යාව			√
	1.6.4	ප්‍රරාවිද්‍යා ස්ථාන ප්‍රවර්ධනය සඳහා විස්තර පුවරු, මාර්ගෝපදේශ පුවරු, ආරක්ෂිත ස්මාරක පුවරු, අනතුරු ඇහයිමේ පුවරු සවි කිරීම - (වසරකට 200)	පුවරු යෙදූ සංඛ්‍යාව			√
	1.6.5	පුරාවිද්‍යා ස්ථාන සඳහා සනිපාරක්ෂක සහ යටිතල පහසුකම් සැපයීම - (වසරකට 05)	ස්ථාන සංඛ්‍යාව			√
	1.6.6	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.	ස්ථාන සංඛ්‍යාව			
	1.6.7	කලාප 96 ක් නඩත්තු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම.	මිලදී ගත් උපකරණ සංඛ්‍යාව			
	1.7	**පුරාවිද්‍යා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**				
	1.7.1	කැණීම් - (වසරකට 10)	ව්‍යාපෘති ගණන			
	1.7.2	ක්ෂේත්‍ර ගවේෂණ හා ලේඛණගත කිරීම් - (වසරකට 20)	ව්‍යාපෘති ගණන			
	1.7.3	අභිලේඛණ හා නාණක විද්‍යා - (වසරකට 10)	ව්‍යාපෘති ගණන			
	1.8	**දෙපාර්තමේන්තු යටිතල පහසුකම් - (ස්ථාන, කළමනාකරණ, භෞතික සම්පත්, ගොඩනැගිලි, කාර්යාල මෙවලම්)**				

ඉලක්කය		උපාය මාර්ගය / අරමුණු	ප්‍රධාන කාර්යසාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	75% - 89%	50% - 74%
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරන උත්සහයන් ශක්තිමත් කිරීම.	1.8.1	නව රසායනාගාර ඉදිකිරීම - (වසරකට 1)	ඉදිකළ රසායනාගාර සංඛ්‍යාව			
	1.8.2	පැරණි රසායනාගාර නවීකරණය කිරීම.	නවීකරණය කළ රසසායනාගාර සංඛ්‍යාව			
	1.8.3	නිල නිවාස 1 නඩත්තු කිරීම හා නිලධාරීන් සඳහා නව නිල නිවාස ඉදිකිරීම.	නඩත්තු කරන ලද හා ඉදිකළ නව නිල නිවාස සංඛ්‍යාව			
	1.8.4	කාර්යාල ගබඩා පහසුකම් හා නව කලාප කාර්යාල ඉදිකිරී - (වසරකට 3)	ඉදිකරන ලද කලාප කාර්යාල සංඛ්‍යාව			√
	1.8.5	වෙනත් - ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා, කෞතුකාගාර අන්තර්ගතව ගොඩනැගිලි 100 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	නඩත්තු කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව			
	1.8.6	සියලුම සංචාරක බංගලා (15) සඳහා පහසුකම් සැපයීම.	සංචාරක බංගලා සංඛ්‍යාව			
	1.8.7	නව සංචාරක බංගලා ඉදිකිරීම - (යාපනය, කතරගම, පඩුවස් නුවර)	ඉදිකරන ලද නව සංචාරක බංගලා සංඛ්‍යාව			
	1.9	**පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය.**				
	1.9.1	වාස්තු විද්‍යා සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක සංඛ්‍යාව			√
	1.9.2	රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය - (බන්දා පොකුණ)	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය		√	

ඉලක්කය	උපාය මාර්ගය / අරමුණු		ප්‍රධාන කාර්යසාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	75% - 89%	50% - 74%
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරන උත්සහයන් ශක්තිමත් කිරීම.	1.9.3	රසායන සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක සංඛ්‍යාව		√	
	1.9.4	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතිය.	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය		√	
	1.10	**පුරාවස්තු අඳෝපනත සංශෝධනය කිරීම**	පුරාවස්තු අඳෝපනත අවශ්‍ය අවස්ථාවන්හිදී සංශෝධනය කිරීමට කටයුතු කිරීම.	√		

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් උද්ගත වූ අහිතකර බලපෑම දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක සාක්ෂාකර ගැනීම බෙහෙවින්ම අභියෝගාත්මක විය. මුල්‍ය ප්‍රතිපාදන සීමා වීම මෙන්ම එම ප්‍රතිපාදනයන් යටතේ වුවද අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට ළඟා වීමට නොහැකි වූ අතර, වර්ෂයේ සැලකිය යුතු කාලපරිච්ඡේදයක් සීමිත නිලධාරී / සේවක පිරිසක් සමඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු සක්‍රීයව පවත්වා ගෙන යාමට සිදු වීම මෙන්ම වැඩ බිම් වෙත තත්කාර්ය සේවකයින් යොමු කිරීමට පැවති අවහිරතාවයන් ද ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක ආරම්භක කටයුතු ප්‍රමාද වීම, සංරක්ෂණ හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් සඳහා පැවති ඉහළ මිල ගණන් හා සැපයුම සීමාසහිත වීම ද මෙහිදී සැලකිය යුතු වේ. එම තත්ත්වය හමුවේ වුවද පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක හඳුනා ගැනීම හා ලේඛනගත කිරීම, පර්යේෂණ කටයුතු, සංරක්ෂණය හා නඩත්තු කර පවත්වාගෙන යාම, මහජන ප්‍රදර්ශන හා ප්‍රවර්ධන වැඩසටහන් යම් ප්‍රමාණයකට හෝ සාර්ථකව සිදු කිරීමට උත්සහ කිරීම තුළින් 87% සමස්ත භෞතික කාර්යසාධනයක් අත්කර ගැනීමට හැකි වීම 2021 වසරේ දෙපාර්තමේන්තුව ලැබූ විශේෂ ජයග්‍රහනයකි.

පුරාවස්තුවල ආරක්ෂාව තහවුරු කෙරෙන පුරාවිද්‍යා පනතෙහි පුරාවස්තු විනාශය වැළැක්වීම හා ක්ෂේත්‍රයේ පැවැත්ම හා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නීති සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පුරාවිද්‍යා අඳෝ පනත සංශෝධනය කිරීමට අදාළ කාර්යයන් ද 2021 වසරේ සිදු කරන ලදි. පුරාවස්තු විනාශ කිරීම් සම්බන්ධව නඩු 383 ක් පමණ ඇති අතර, අය කර ගන්නා ලද දඩ මුදල රු.මි. 46.432 ක් පමණ වේ.

06.පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 2021.12.31 දිනට

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	54	15	39
තෘතීයික	56	22	34
ද්විතියික*	829	595	195
ප්‍රාථමික**	3,434	1,226	2,199

6.2. **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

* තනතුරු 232 ක් විශ්‍රාම යාමෙන් පසු අහෝසි වේ.

** තනතුරු 20 ක් විශ්‍රාම යාමෙන් පසු යටපත් වේ.

ප්‍රාථමික සේවා ගණයේ නව තනතුරු 1,865 ක් සහ ද්විතියික සේවා ගණයේ තනතුරු 75 ක් අනුමත වීම හේතුවෙන් පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පෙන්නුම් කෙරේ. ප්‍රාථමික සේවා ගණයට අයත් PL – 01 ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ ද එම කටයුතු අත්හිටුවීමට සිදුවූ අතර, ඉදිරියේදී බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මඟින් එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ඇත.

ද්විතියික සේවා ගණයට අයත් නව තනතුරක් වන කාර්මික සහකාර තනතුරු 75 ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත. විභාග දෙපාර්තමේන්තුව විසින් එම විභාගය පැවැත්වීමෙන් පසුව බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ලැබේ.

දැනට රාජකාරී ආවරණය සඳහා නිලධාරීන් පත් කිරීම මඟින් හා තත්කාර්ය පදනම මත කාර්ය මණ්ඩලය යෙදවීම මඟින් අදාළ රාජකාරී ඉටු කර ගනු ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කලසීමාව	සමස්ත ආයෝජනය (දේශීය රුපියල්)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
1.	පාෂාණ සංරක්ෂණ වැඩමුළුව.	14	දින 03	31,640.00	දේශීය	රසායන සංරක්ෂණ කාර්යයේ යෙදෙන නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන්ට සංරක්ෂණ කාර්යය ඉටු කර ගැනීමට එම දැනුම ඉවහල් වේ.
2.	කෑගල්ල දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප ප්‍රවර්ධන වැඩ සටහන.	140	දින 01	115,891.00	දේශීය	මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු මූල්‍ය තත්ත්වය පිළිබඳ අවබෝධය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කාර්යභාරය හඳුනා ගැනීම තුළින් පුරාවිද්‍යා ස්ථාන ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙන යාම. මානසික ආතතියෙන් මිදී කටයුතු කිරීම.
3.	Zoom තාක්ෂණය ඔස්සේ දෙපාර්තමේන්තු පුහුණු කටයුතු දේශන 30 ක් කිරීම.	මාර්ග ගත ක්‍රමය ඔස්සේ දේශන 30 ක් සඳහා සහභාගිත්වය	එක් දේශනයක් පැය 02 බැගින් දේශන 30 ක්	123,340.00	දේශීය	වාස්තු විද්‍යා, අභිලේඛන, කැණීම්, කෞතුකාගාර, ගවේෂණ, නඩත්තු හා ගිණුම් යන අංශ යටතේ දේශන වාර කිහිපයක් තුළින් රාජකාරී දැනුම හා අවබෝධය ලබා ගැනීම.
4	පුරාවස්තු විනාශය වැළැක්වීමේ වැඩමුළුව	38	දින 01		දේශීය	පුරාවස්තු විනාශය වැළැක්වීමේ රාජකාරී කටයුතු කෙරෙන නිලධාරීන්, වෙනත් ආයතන නිලධාරීන්, මාධ්‍යවේදීන්, ඇතුළුව ඒ පිළිබඳ අත්දැකීම් හා අවබෝධය ලබා ගැනීම.

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වීම.

ශාස්ත්‍රීය කටයුතු ඉටු කරන දෙපාර්තමේන්තුවක් වශයෙන් එම ශාස්ත්‍රීය දැනුම යාවත්කාලීන කිරීම අවශ්‍ය වන බැවින් දේශීය හා විදේශීය පුහුණු ලබා දීම අවශ්‍ය වේ. තවද කාර්ය පරිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි කාර්යාල ක්‍රමවේදයන් පිළිබඳව ද, සේවක දැනුම අල්ප බැවින් ඒ සම්බන්ධව ද පුහුණුව ලබා දිය යුතුව ඇත. රාජකාරී කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ආකල්පමය වෙනසක් නිරන්තරයෙන් ගොඩනැගිය යුතු බැවින් ආකල්ප සංවර්ධනාත්මක වැඩසටහන් ද, ඵලදායීතා විෂය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සිදු කළ යුතුය.

7.පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	වාණිජ අත්තිකාරම් ගිණුම් නැත.	
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් නැත.	
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6.	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ (වාහන සම්බන්ධ හානි පාඩු ලේඛනය පවත්වා ගෙන යනු ලැබේ.		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)**			
3.1.	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2.	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල නොවේ	විවිධ අංශ හෝ ප්‍රාදේශීය කාර්යාල වලින් තොරතුරු කැඳවීමට සිදුවන අවස්ථාවන්වලදී අවසන් පිළිතුර විගණකාධිපතිවරයා වෙත යැවීමට යම් ප්‍රමාදයක් ඇති වේ.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1.	මු.රෙ. 134(2) DMA/1 - 2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	පිළිතුරු සැපයීමට අදළ තොරතුරු ප්‍රාදේශීය කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලයට කඩිනමින් ඉදිරිපත් නොකිරීම.	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ඇති වැදගත්කම ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන් දැනුවත් කිරීම.
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(4) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1.	DMA චක්‍රලේඛ 1 - 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ (2021 වර්ෂයේදි කමිටු රැස්වීම් 3ක් පවත්වා ඇත.)	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට නොහැකි වීම.	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් තත්ත්වය සමඟ වයඹ කාර්යාලයේ සමීක්ෂණ කටයුතු ප්‍රමාද වූ අතර, සෙසු කර්යාලවල සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. වයඹ කාර්යාලයේ සමීක්ෂණ කටයුතු 2022 වර්ෂයේ මුල් කාලය තුළ අවසන් කර ඇත.	
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් වසංගත කාලය තුළ අපහරණ කටයුතු අප්‍රමාදව ඉටු කිරීමට නොහැකි විය.	
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	-		
9	**වාහන කළමනාකරණය**			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2.	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් වසංගත කාලය තුළ චෙක්පත් මඟින් තොරතුරු සොයාගත නොහැකි වීම හේතුවෙන් ප්‍රමාද වී ඇත.	මේ වනවිට නිරවුල් කරමින් පවතී.
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
11.2.	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1.	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2.	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	කොවිඩ් වසංගත කාලය තුළ තොරතුරු සොයාගත නොහැකි වීම හේතුවෙන් ප්‍රමාද වී ඇත.	ණය ශේෂ නිරවුල් කරමින් පවති.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල නොවේ	ආදයම් ගිණුම් ක්‍රියාත්මක නොවේ.	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
15.2.	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල නොවේ	ආදයම් ගිණුම් ක්‍රියාත්මක නොවේ.	
15.3.	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	ආදයම් ගිණුම් ක්‍රියාත්මක නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3.	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.			
17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1.	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
18.2.	එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තොරතුරු එක් රැස් කිරීම.	2022 වර්ෂයේ සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තොරතුරු 2021 වර්ෂයේ එක් රැස් කොට අදාළ අංශයට භාර දී ඇත.
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ		
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	අදාළ අංශ ප්‍රධානියාට වගකීම් පවරා ඇත.	
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල නොවේ	80% පමණ නිවරදි කර ඇත.	